වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT 2019




ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்

NATIONAL FILM CORPORATION OF SRI LANKA

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව



වාර්ෂික වාර්තාව

2019

පිළිගැන්වීම

මගේ අංක NFC/119/02/02/09

ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින්

ගරු විදුර වික්‍රමනායක මැතිතුමා
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
8 වන මහල
සෙත්සිරිපාය
බත්තරමුල්ල

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - වාර්ෂික වාර්තාව -2019

1980 අංක 45 දරණ පනතින් සංශෝධිත 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා පහත සඳහන් ලේඛනයන්ද සමග සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

1. 2019 වසරේ සංස්ථාව විසින් කරන ලද කාර්යයන් හා අදාල ප්‍රකාශ
2. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා සංස්ථාවේ ලාභලාභ ගිණුම්, ආශ්‍රිත සටහන් හා එදිනට ශේෂ පත්‍රය
3. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණකාධිපති වාර්තාව

මෙයට විශ්වාසී වූ

ජී. ඒ. කිත්සිරි
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

පාලන වාර්තාව

01. හැඳින්වීම

02. අධ්‍යක්ෂ මණ්ඩලය

03. දේශීය චිත්‍රපට නිෂ්පාදනයහාචිත්‍රපට ප්‍රචාරණය/ සිනේ ඇඩිස්

04. පිරිස් හා ආයතන පාලනය

05. අභ්‍යන්තර විගණන කටයුතු

06. සිනමා සංස්කෘතිය හා අධ්‍යාපන කටයුතු

07. දේශීය සැපයුම් - ආනයන හා අපනයන

08. චිත්‍රපට බෙදාහැරීම් හා ගබඩාව

09. නෛතික කටයුතු

10. චිත්‍රාගාරය

11. විමර්ශන කටයුතු

12. මූල්‍ය කටයුතු

13. සැලසුම්, සංඛ්‍යාලේඛන හා පුහුණු

14. වෛද්‍ය සහනාධාර ක්‍රමය

15. සුභ සාධක සංගමය

16. ආගමික කටයුතු

17. ක්‍රීඩා සංගමය

18. වෘත්තීය සමිති

19. ස්තූතිය

01.හැදින්වීම

1980 අංක 45 දරණ පනතින් සංශෝධනය කල 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේගරු අග්‍රාමාත්‍ය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාහා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2019 වර්ෂය පිළිබඳ වාර්තාව.

2019 වර්ෂය පිළිබඳ ඉදිරිපත් කරන මෙම වාර්තාව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 47 වන ක්‍රියාත්මක වර්ෂයට අදාල වේ.

02.අධ්‍යක්ෂ මණ්ඩලය

2019 වර්ෂය තුළ ජාතික චිත්‍රපට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

2019.01.01 සිට 2019.01.16 දින දක්වා සුනිල් එස් සිරිසේන මහතා විසින් සභාපති වශයෙන් කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය 2019.02.01 සිට 2019.05.22 දක්වා

අනුෂා ගෝකුළ ප්‍රනාන්දු මිය	-	සභාපති
කුමාර ජයකාන්ත මහතා	-	ක්‍රියාකාරී අධ්‍යක්ෂ
ඒරානන්ද හෙට්ටිආරච්චි මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්)
නාලක කළුවැව මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්)
බී.එම්.ඩී.එන්.බාලසූරිය මිය	-	භාණ්ඩාගාර නියෝජිත
සුධීර නිලංග විතාන මහතා	-	සංස්කෘතික අධ්‍යක්ෂ වෙනුවට
මහාචාර්ය පැට්‍රික් රත්නායක	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
මහාචාර්ය කේ. ජී.අමරසේකර	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පි.වී.පි.දයාරත්න මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
අනුර රත්නායක මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපටසංස්ථා 2019.05.23 සිට 2019.12.06 දක්වා

අනුෂා ගෝකුළ ප්‍රනාන්දු මිය	-	සභාපති
කුමාර ජයකාන්ත මහතා	-	ක්‍රියාකාරී අධ්‍යක්ෂ
ඒරානන්ද හෙට්ටිආරච්චි මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්)
නාලක කළුවැව මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්)
බී.එම්.ඩී.එන්.බාලසූරිය මිය	-	භාණ්ඩාගාර නියෝජිත
සුධීර නිලංග විතාන මහතා	-	සංස්කෘතික අධ්‍යක්ෂ වෙනුවට
මහාචාර්ය පැට්‍රික් රත්නායක	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
මහාචාර්ය කේ. ජී.අමරසේකර	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පි.වී.පි.දයාරත්න මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
අනුර රත්නායක මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

03.දේශීය චිත්‍රපට නිෂ්පාදනයහා චිත්‍රපට ප්‍රචාරණය/ සිනේ ඇඩිස්

❖ **2019 වසරේ දේශීය චිත්‍රපට ලියාපදිංචිය.**

2019 ජනවාරි මස සිට ජුනි මස දක්වා ලියාපදිංචි ගාස්තු රු. 3000.00 බැගින් චිත්‍රපට 42 ක් සහ ජුලි මස සිට දෙසැම්බර් මස දක්වා රු.5000.00 බැගින් චිත්‍රපට 23 ක් ලියාපදිංචි කිරීම.

❖ 2019 වසරේ දේශීය සිනමා කර්මාන්තයට සුවිශේෂී මෙහෙවරක් ඉටුකරන ලද කලාකරුවන් ඇගයීම හා රු.50,000.00 බැගින් මුල්‍ය ප්‍රදානය ලබා දීම.

1) සුජාතා අත්තනායක මිය
2) හෙලන් කුමාරි මිය
3) එච්.එම්. ජයවර්ධන මයා
4) එස්.එම්. සරත් මයා
5) සුගතපාල සෙනරත් යාපා මයා
6) සෝභනී අමරසිංහ මිය
7) මානෙල් වානගුරු මිය
8) සුමින්ද සිරිසේන මයා
9) සැනට් දික්කුඹුර මයා
10) ජයලත් මනෝරත්න මයා
11) හේමසිරි ලියනගේ මයා
12) හේමසිරි සෙල්ලප්පෙරුම මයා
13) ලියෝනි කොතලාවල මිය
14) ඇල්ෆ්‍රඩ් පෙරේරා මයා
15) රොබින් ප්‍රනාන්දු

- ඇන්ජලින් ගුණතිලක මහත්මියගේ අභාවය වෙනුවෙන් 2019/04/01දිනරු.100,000.00 මුල්‍යාධාරයක්ලබාදීම.
- මාක් සැමිසන් මහතාගේ අභාවය වෙනුවෙන් 2019/01/20 දින රු. 50,000.00 මුල්‍යාධාරයක් ලබා දීම.
- ප්‍රියංකර පෙරේරා මහතාට රු.50,000.00 වෛද්‍යාධාරයක් ලබා දීම.
- ඉන්දානි සේනාරත්න මහත්මියගේ අභායව වෙනුවෙන් රු.50,000.00 මුල්‍යාධාරයක් ලබා දීම.
- ජාත්‍යන්තර ඇගයීමට පත් දේශිය කලාකරුවන් ඇගයීම වෙනුවෙන් පහත මුල්‍ය පරිත්‍යාග පිරිනමන ලදි.

1)	නිටා ප්‍රනාන්දු මහත්මිය	-50,000.00
2)	නිල්මිණි සිගේරා මහත්මිය	-50,000.00
3)	විසා කේසවන්ද්‍රසේකරම් මහතා	-50,000.00
4)	ඩී. නිශාදි රුවන්මාලි මහත්මිය	-25,000.00
5)	රංග බන්ඩාරනායක මහතා	-25,000.00
6)	ආර්.එච්. ශිරාන් රත්නායක මහතා	-25,000.00
7)	කුමාර කරම්දෙනිය මහතා	-50,000.00
8)	අතුල පීරිස් මහතා	-25,000.00

- ඒ.වී. රත්නවීර ද සිල්වා මහතාට රු.50,000.00 ක වෛද්‍යාධාරයක් ලබා දීම.
- සිනමා ශිල්පී සහ පැරණි චිත්‍රපට සඳහා අනන්‍යතාවය සහතික කිරීමේ ලිපි නිකුත් කිරිම.
- ශ්‍රී ලංකා රේගුව වෙත රේගු නිෂ්කාශන ලිපි නිකුත් කිරිම.
- දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත සිනමාශාලා වෙනුවෙන් බදු සහන ලබාදීම සඳහා තහවුරු ලිපි නිකුත් කිරිම.
- රංගන ශිල්පීන් හා කාර්මික ශිල්පින් සඳහා සිනමා ශිල්පි හැඳුණුම්පත් ලබා දීම.
- චිත්‍රපට ප්‍රදර්ශනයට අදාල අත්‍යවශ්‍ය භාණ්ඩ සිනමාශාලා විසින් ආනයනය කිරිමේදි එම භාණ්ඩ රේගුවෙන් නිදහස් කර ගැනීමට අවශ්‍ය රේගු නිෂ්කාශන ලිපි නිකුත් කිරිම.
- රූගත කිරිම් වලට හා චිත්‍රපට උළෙල සඳහා සිනමාවට අදාල කටයුතු වෙනුවෙන් විදේශ ගත වන සිනමා ශිල්පීන්ගේ අනන්‍යතාවය තහවුරු කර ලිපි නිකුත් කිරිම.
- සිනමා ශිල්පීන්ගේ සුභ සාධන කටයුතු සඳහා සහය ලබා දීම.
- මෙරට රූගත කරනු ලබන දේශිය හා විදේශ චිත්‍රපට සහ අනෙකුත් වැඩසටහන් සඳහා විදේශයෙන් ආනයනය කරනු ලබන කැමරා ඇතුළු තාක්ෂණික මෙවලම් සඳහා ශ්‍රී ලංකා රේගුව වෙත ඇපකරයක් ලබා ගැනීමට අනතුරු රේගු නිෂ්කාශන ලිපි නිකුත් කිරිම.

Film Import Summary - 2019

CIRCUIT	Total Film	Amount
EAP	**26**	130,000.00
CEL	**49**	245,000.00
LFD	**34**	170,000.00
MPI	**34**	170,000.00
RITHMA	**28**	140,000.00
BOM	**9**	45,000.00
Total	**180**	**900,000.00**

Approved Quota	
Tamil	**70**
English	**65**
Hindi	**25**
Total	**160**

CIRCUIT	English	Tamil	Hindi	
EAP	**9**	**13**	**4**	
CEL	**12**	**26**	**11**	
LFD	**14**	**15**	**5**	
MPI	**17**	**14**	**3**	
RITHMA	**11**	**22**	**4**	
Total	**63**	**90**	**27**	**180**

Non- Refund Amount	**25,000.00**
Number of applicants -2019	**19**
	475,000.00

- දේශීය සිනමාවේ 72 වන සැමරුම හා චිත්‍රපට සංස්ථාවට වසර 47 සපිරීමේ උත්සව කටයුතු (2019.01.21)
- කලාකරුවන් සඳහා පැවැති දේශීය වෛද්‍ය සායන කටයුතු (2019.03.22)
- මාසිකව පැවැත්වෙන "ජීවිතයට සිනමාව කතිකාව" ප්‍රචාරක කටයුතු
- 2016,2017,2018 වර්ෂ පාදකව පැවැත්වෙන ජනාධිපති සිනමා සම්මාන උළෙල - 2019 සංවිධාන කටයුතු - (2019 ජූලි)

04. පිරිස් හා ආයතන පාලනය

කාර්ය මණ්ඩලය	
අනුමත සංඛ්‍යාව	186
ස්ථීර සංඛ්‍යාව	113
වර්ෂය තුළ බඳවාගත් සේවක සංඛ්‍යාව	34
වර්ෂය තුළ ඉවත් වූ සංඛ්‍යාව 2019	
විශ්‍රාම ලැබූ සේවක සංඛ්‍යාව	01
සේවයෙන් ඉල්ලා අස්වූ සේවක සංඛ්‍යාව	01
සභාපති	01
ක්‍රියාකාරී අධ්‍යක්ෂ	01
දෛනික දීමනා	-
අනියම්	01
රාජකාරී ඉටුකිරීම	02
පුහුණු	-
2019.12.31 දිනට මුළු සේවකයින්	**147**

4.2 ආයතන පාලනය හා සේවක අවශ්‍යතා ඉටුකිරීම

ආයතනයේ සේවක පාලනයට අදාලව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයමින් සේවා කටයුතු ඉටුකර ඇත.

05. අභ්‍යන්තර විගණන කටයුතු

1971 අංක 18 දරණ පනත සහ සංශෝධිත පනතේ අරමුණු ලගාකර ගැනීම සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව 2019 වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන විගණකාධිපතිගේ උපදෙස් පරිදි සකස් කරන ලදී.

වර්ෂය තුල ඉදිරිපත් කර ඇති අභ්‍යන්තර විගණන වාර්තා 29 කි.

විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම

2019 - කමිටු සාමාජික නාමලේඛනය පහත සඳහන් වේ.

01. බී.එම්.ඩී.එන් බාලසූරිය මිය	-	භාණ්ඩාගාර නියෝජිත (කමිටු සභාපති)
02. නාලක කලුවැව මයා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
03. ඒරානන්ද හෙට්ටිආරච්චි මයා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
04. පී.වී.පී දයාරත්න මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
05. අනුර රත්නායක මයා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
06. උපුල් ප්‍රේමචන්ද්‍ර මයා	-	රජයේ විගණන කාර්යාලය
07. ආර්.එස් සමරක්කොඩි මයා	-	සංස්කෘතික අමාත්‍යාංශය
08. ලේකම් - වත්සලා වික්‍රමාරච්චි මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
09. කැදවුම්කරු - ඩබ්ලිව්.ශ්‍රියානි හංවැල්ල මිය	-	අභ්‍යන්තර විගණක

2019 වර්ෂය සඳහා රැස්වීම් 4ක් පහත සඳහන් දිනවල පවත්වා ඇත.

2019/03/22
2019/06/18
2019/08/02
2019/10/21

06. අධ්‍යාපන, ප්‍රවර්ධන හා සංස්කෘතික අංශය

<u>සිනමා රසවින්දන වැඩසටහන්</u>

දිනය	ආයතනය	දිස්ත්‍රික්කය
2019.02.08	1.අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2.බෙලි අත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	මාතර
2019.02.21	1. කොටපල, දෙණියාය ජාතික පාසල 2.පස්ගොඩ රොටුඹ මහාවිද්‍යාලය	ගාල්ල
2019.02.22	1.තවලම ඕපාත මහාවිද්‍යාලය 2.ඇල්පිටිය ආනන්ද මධ්‍ය මහාවිද්‍යාලය	ගාල්ල
2019.03.15	1. බණ්ඩාරවෙල- පුරහල 2. බොරලන්ද පොලිස් අභ්‍යාස ආයතනය	බදුල්ල
2019.03.19	ශාන්ත ආනා දේවස්ථානය - ගල්කිස්ස	කොළඹ
2019.03.21	මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	කොළඹ

2019.03.22	පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	කොළඹ
2019.04.03	1.වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2.අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	කළුතර
2019.06.20	1. උඩුබද්දාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය 2. බිංගිරිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	කුරුණෑගල
2019.06.21	ගලිගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	කෑගල්ල
2019.09.05	යටිනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	මහනුවර
2019.09.06	දෙල්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	මහනුවර
2019.09.14	1.බණ්ඩාරවෙල උෆව අධ්‍යාපන විද්‍යාපීඨය 2.දියතලාව යුධහමුදා කඳවුර	බදුල්ල
2019.09.23	කොටවෙහෙර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය (නිකවැරටිය)	කුරුණෑගල
2019.10.21	මාවතගම ජාතික පාසල	කුරුණෑගල
2019.10.21	ඇහැලියගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	රත්නපුර
2019.10.21	කුරුවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	රත්නපුර
2019.11.01	නුවර එළිය නගර ශාලාව	නුවරඑළිය
2019.11.05	කොත්මලේ තොන්ඩමන් සංස්කෘතිකශාලාව	මහනුවර
2019.11.06	මිණිපෙ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	මහනුවර

<u>සිනමා කතිකාව වැඩසටහන</u>

<u>දිනය</u>	**<u>තේමාව</u>**	**<u>ස්ථානය</u>**
2019.02.27	චිත්‍රපට මූලිකවූ මහාසිනමාව	සෙන්ටර් කොබ්බෑකඩුවගොවි පර්යේෂණ ආයතනය
2019.03.27	21 වන සියවසේ සිනමාව	මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරය
2019.05.29	ජීවිතය දර්ශනය හා සිනමාව	තරංගනී සිනමාශාලාව
2019.06.26	සිනමාරූපනය	තරංගනී සිනමාශාලාව
2019.07.31	සිනමාව විපරීත කලාවක්ද?	තරංගනී සිනමාශාලාව
2019.08.28	සංඛ්‍යාංක දෘෂ්‍ය සංස්කෘතිකඅවදියේ සිනමාරසවින්දනයේ විශේෂතා	තරංගනී සිනමාශාලාව
2019.10.31	සිනමා කර්මාන්තයේ ප්‍රවර්ධනයට අධ්‍යාපනයේ බලපෑම	තරංගනී සිනමාශාලාව
2019.11.27	වීරකාව්‍ය සිනමාව	තරංගනී සිනමාශාලාව

සිනමා ප්‍රකාශන

ග්‍රන්ථ

1. අසිරිමත් සිනමා රූපාවලිය - ඩොනල්ඩ්
2. සිනමාව ලෝකනය

සඟරා

1. චිත්‍රපට සඟරාව-2019 පළමු කලාපය
2. චිත්‍රපට සඟරාව-2019 දෙවන කලාපය

සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව -2019

- පාඨමාලා කාලය වර්ෂයකි.
- සතිඅන්ත දිනවල පැවැත්වේ.
- සිනමා ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් හා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය යටතේ පැවැත්වේ.
- 2019 ලියාපදිංචි සිසුන් ගණන 40 යි.

සිනමා අධ්‍යාපන ප්‍රදර්ශන කුටි

- 2019 වර්ෂයේ ජාතික යොවුන්පුරය - තිස්සමහාරාමය
- සාහිත්‍ය කලා මහෝත්සවය - බණ්ඩාරවෙල

2019 වර්ෂයෙහි පුස්තකාලය සඳහා මිලදී ගත් ග්‍රන්ථ

රූපකල්පනය හා ගීත දෘෂ්‍යකරණය

හෙළසිනමා බල ඇණිය – රූප ජායා 6

බෝගල සවුන්දිරිස්- තිරනාටකය

කුටුම්භය ලිංගිකත්වය හා දේශපාලනය

සිනෙරු විමසුම්

සිනමා කලාව

මදුරවසන්තේ

06. දේශීය සැපයුම් - ආනයන හා අපනයන

සංස්ථාව සහ සේවා සැපයුම්කරුවන් වෙත අවශ්‍ය භාණ්ඩ හා සේවා ඉල්ලුමට අනුකූල සැපයීම වර්ෂය තුල ඉටුකර ඇත.

08. බෙදාහැරීම් හා ගබඩා

චිත්‍රපට ප්‍රදර්ශනය

- 2019 වර්ෂය තුළදී රිත්මා මණ්ඩලය යටතේ සිනමාශාලා 67 ක් ක්‍රියාත්මක විය.
- මොරටුව - මැක්ස්ලයිට්, මාතලේ - අමා, කල්මුනේ - ජී.කේ සිනේමැක්ස් යන සිනමාශාලා රිත්මා මණ්ඩලය යටතේ නව සිනමාශාලා වශයෙන් ආරම්භ කර ඇත.
- තාවකාලිකව වසා තබන ලද දික්වැල්ල - එච්.ආර් හසලක - හසලක යන සිනමා ශාලාවන් 2019 වර්ෂයේ නැවත චිත්‍රපට ප්‍රදර්ශන කටයුතු ආරම්භ කර් ඇත.

චිත්‍රපට මුද්‍රාහැරීම

- සිනමා ශාලා 67ක් සඳහා රිත්මා මණ්ඩලය විසින් චිත්‍රපට මුද්‍රාහැර ඇත.
- 2019 වර්ශය තුල රිත්මා මණ්ඩලය හා අනෙකුත් මණ්ඩල සමඟ ඒකාබද්ධ වී චිත්‍රපට මුද්‍රා හැරීමට කටයුතු කර ඇත .
- 2019.06.18 දින සිට 2019.07.18 දින දක්වා ගරු අධිකරණය විසින් ලබාදුන් චිත්‍රපට බෙදාහැරීම සම්බන්ධයෙන් වූ තීන්දුව ප්‍රකාරව ජාතික චිත්‍රපට සංස්ථාව විසින් චිත්‍රපට මුද්‍රාහැරීම සඳහාද කටයුතු කර ඇත.
- රිත්මා මණ්ඩලය මගින් සිංහල චිත්‍රපට 07ක් මුද්‍රාහැරීමට කටයුතු කර ඇත.
- මෙම වර්ෂයේ ජනවාරි සිට සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ලද දම්ල චිත්‍රපට 21 ක් හා හින්දි චිත්‍රපට 04 ක් හා දේශීය දම්ළ චිත්‍රපට 1 ක් රිත්මා මණ්ඩලයේ හා අනෙකුත් මණ්ඩල සිනමා ශාලාවන් හා ඒකාබද්ධ වී මුද්‍රාහැරීමට කටයුතු කර ඇත.
  (සංස්ථා මණ්ඩලය වෙත ලබාදී ඇති කොටසින් (කෝටා) චිත්‍රපට ලබාගෙන රිත්මා මණ්ඩලය විසින් මුද්‍රාහැරීම විසින් මුද්‍රාහැරීමට කටයුතු කර ඇත)

චිත්‍රපට කුළිය

අප මණ්ඩලය විසින් අනෙකුත් මණ්ඩල වලට සපයන ලද චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි චිත්‍රපට කුළී මුදල් ලැබී ඇත. (2019 දෙසැම්බර් මස දක්වා)

- ලංකා සෙල්ම්ස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පනි (පුද්) සමාගම - රු 3176481.30
- මූවී ප්‍රොඩියුසර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් (පුද්) සමාගම - රු 1928461.19
- සිනමා එන්ටර්ටේන්මන්ට් (පුද්) සමාගම - රු 11953684.28
- ඊ.ඒ.පී ෆිල්ම්ස් ඇන්ඩ් තියටර්ස් (පුද්) සමාගම - රු 4964002.51

අප මණ්ඩලය අනෙකුත් මණ්ඩල වලින් ලබාගත් චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි මුදල් ගෙවා ඇත.(2019 දෙසැම්බර් දක්වා)

- ලංකා සෙල්ම්ස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (පුද්) සමාගම - රු 4393472.19
- මූවි ප්‍රොඩියුසර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් (පුද්) සමාගම - රු 9255239.45
- සිනමා එන්ටර්ටේන්මන්ට් (පුද්) සමාගම - රු 26479558.21
- ඊ.ඒ.පී ෆිල්ම්ස් ඇන්ඩ් තියටර්ස් (පුද්) සමාගම - රු 24874616.28

රිපෝ තැන්පතු

2019 වර්ෂය තුල රිපෝ තැන්පතු ලෙස රු .28290737.80 ක් මුදලක් ආයෝජනය කර ඇත .

2019 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු මස දක්වා කොමිස් මුදල් ආදායම රු 19302000.67 ක් පමණ වේ .

- 2019 වර්ශය තුළ විවිධ සමිති සමාගම් හා විශ්ව විද්‍යාල හා පාසැල් සිසුන් සඳහා සහන මිලක් යටතේ ආධාර ලබා ගැනීම සඳහා චිත්‍රපට ලබාදීම
- පොලිස් අහස විද්‍යාල සඳහා හා හමුදා කඳවුරු සඳහා සහන මිලකට හා නොමිලේ චිත්‍රපට ලබාදීම.

09. නිති අංශ

- සංස්ථාව පාර්ශවයක් වන නඩු සම්බන්ධයෙන් සංස්ථාව වෙනුවෙන් පෙරකලාසි ගොනු කිරීම හා අදාල අධිකරණයේ සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.
- කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරියේ කම්කරු ආරවුල් සඳහා සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.
- ජාතික චිත්‍රපට සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන චිත්‍රපට,ආනයනය කරනු ලබන චිත්‍රපට,චිත්‍රපට බෙදාහැරීමසම්බන්ධයෙන් සහ චිත්‍රපට නිෂ්පාදනය/චිත්‍රාගාර සේවා/ පිටපත් මුද්‍රණය/ උපශීර්ෂ පාඨ යෙදීම/ප්‍රචාරක කටයුතු සඳහා ණය මුදල් ලබා දීම සහ සේවා සැපයීමේ සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.
- ජාතික චිත්‍රපට සංස්ථාවට උපකාරක සේවා ලබා ගැනීම සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.
- එදිනෙදා අවශ්‍යතාවය පරිදි සංස්ථාවේ ඕනෑම අංශයකින් යොමුකරන නීතිමය ගැටලු සඳහා උපදෙස්ලබා දීම.

අධිකරණ කටයුතු

සංස්ථාව පාර්ශවයක් වන පහත සඳහන් නඩු / පැමිණිලි සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු නීති අංශය මගින් ඉටුකර ඇත.

1. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක : SC/HCCA/LA/329/2019
2. අභියාචනාධිකරණ නඩු අංක : CA/WRIT 308/2019
3. අභියාචනාධිකරණ නඩු අංක : CA/WRIT 309/2019
4. අභියාචනාධිකරණ නඩු අංක : CA/WRIT 329/2019
5. අභියාචනාධිකරණ නඩු අංක : CA/WRIT/239/2019
6. අභියාචනාධිකරණ නඩු අංක : 870/99
7. බස්නාහිර පලාත්බද සිවිල් අභියාචනා මහාධිකරණය නඩු අංක : WP/HCCA/COL/114/2019/LA
8. බස්නාහිර පලාත්බද සිවිල් අභියාචනා මහාධිකරණය නඩු අංක : WP/HCCA/13/COL/2019/LA
9. වාණිජ මහාධිකරණය නඩු අංක : CHC/MR/23/19
10. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP 0099/18
11. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP 00131/2018
12. කොළඹ දිසා අධිකරණ නඩු අංක : 1126/2012
13. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DMR/2306/2013
14. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP 166/17
15. කොළඹ දිසා අධිකරණ නඩු අංක : 140/2015
16. මාතර දිසා අධිකරණ නඩු අංක : ප්‍රෝ/318
17. මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක : CO01/29/2018
18. කම්කරු විනිශ්චය සභා නඩු අංක : 13-41-2013
19. බේරුම්කරණ අංක : A/11/2019
20. මානව හිමිකම් පමිණිලි අංක : HRC/2804/19
    HRC/2754/19
    HRC/2994/18
    HRC/2805/19
    HRC/2571/19

10. චිත්‍රාගාර සේවාවන් සැපයීම

චිත්‍රාගාර සේවාවන් සහ කාර්යයන් - 2019

01. ශබ්ද අංශය ශබ්ද මිශ්‍රණ කටයුතු, දෙබස් පටිගත කිරීමේ කටයුතු සහ Track Lating අදාල ව සේවා සැපයූ චිත්‍රපට

	චිත්‍රපටය/ ආයතනය
01	නිහඬ සෙවනැලි චිත්‍රපටය
02	Bullet Proof Children
03	Rush චිත්‍රපටය
04	විෂමභාග චිත්‍රපටය
05	හුස්ම චිත්‍රපටය
06	ආයු චිත්‍රපටය
07	යුගාත්‍රා චිත්‍රපටය
08	රජ දහන චිත්‍රපටය
09	U Turn චිත්‍රපටය
10	ගොවි තාත්තා චිත්‍රපටය
11	ශ්‍රී ලංකා පදනම් ආයතනය
12	ඊතලය චිත්‍රපටය
13	සුනාමි චිත්‍රපටය

02. සංස්කරණ අංශය

2018 මැයි සිට සංස්කරණ පද්ධතිය අක්‍රීයව පවතී.

03. රූගත කිරීමේ මැදිරියේ සහ චිත්‍රාගාර පරිශ්‍රය ලබාදීම්

	චිත්‍රපටය/ ආයතනය
01	Derana – 60 Plus
02	Super Star චිත්‍රපටය
03	Ambient Luxe (Pvt) Ltd
04	මිදුණු විශ්වය චිත්‍රපටය
05	Derana – Little Star Season 10
06	RDB බැංකුව

04. සංරක්ෂණාගාරය (චිත්‍රපට පිරිසිදු කිරීම)
2019 වර්ෂයේ චිත්‍රපට රීල් 400ක් පමණ පිරිසිදු කර ඇත.

05. ශබ්ද අංශය
ශබ්ද අංශයට Folly Sound පටිගත කිරීමේ මැදිරිය ස්ථාපිත කිරීම. (අවසන් කර නොමැත)

චිත්‍රාගාරයේ වාර්ෂික ආදායම රු. 4,496,612.50

11. විමර්ශන

2019 වර්ෂය තුල විමර්ශන අංශය විසින් ඉටු කරන ලද කාර්යන්

01. සිනමාශාලා ඉදිකිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි පිලිබඳ තොරතුරු රැස් කිරීම
02. නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම
03. සිනමාශාලා පරීක්ෂා කිරීම හා අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම
04. විදේශ රූගත කිරීම් අධීක්ෂණය
05. සිනමාශාලා වල තත්වය සොයා බලා ප්‍රවේශ පත්‍ර ගාස්තු සංශෝධනය සඳහා නිර්දේශ ලබා දීම.
06. මත්පැන් බලපත්‍ර සඳහා අවශ්‍ය නිශ්කාෂන ලිපි නිකුත් කිරීම.

01.සිනමාශාලා ඉදිකිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස් කිරීම

2019 වර්ෂය තුල සිනමා ශාලා ඉදිකිරීම සම්බන්ධ තොරතුරු රැස් කිරීම හා ඉදිවෙමින් පවතින සිනමාශාලා

01) යාපනය දිස්ත්‍රික්කය - කෝපායි නගරයේ සිනමාශාලා සංකීර්ණය
02) කොච්චිකඩේ
03) Kandy Municipal Council Complex
04) දෙමටගොඩ
05) වව්නියාව
06) කොට්ටාව
07) යාපනය - කෝපායි
08) පොළොන්නරුව

02.නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම

2019 වසර තුල විවෘත කරන ලද නව සිනමාශාලා

01) PVR සිනමා කොළඹ - 09 සිනමා
02) GK සිනේමැක්ස් 02 කල්මුණේ - 01
03) අමා සිනමා -මාතලේ - 01
04) මැක්ස් ලයිට් - මොරටුව - 01
05) ජනජය - රාජගිරිය - 01
06) සැවෝයි ප්‍රිමියර් - ගම්පහ - 01
07) සැක්සෝන් - බම්බලපිටිය - 01

03.සිනමාශාලා පරීක්ෂා කිරීම

පරීක්ෂණ අංශයේ ප්‍රධාන රාජකාරිය වන්නේ සිනමාශාලා පරීක්ෂා කිරීමයි.
2019 වර්ෂයේ පරීක්ෂණ වාර 918

<u>සිනමාශාලා වල සිදුවන අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම</u>

පරීක්ෂණ නිලධාරින් විසින් සිනමාශාලා පරීක්ෂා කිරීමේදී විවිධ අක්‍රමිකතා හඳුනා ගෙන ඇත.ඒ සඳහා සංස්ථා වක්‍රලේඛ පරිදි කටයුතු කරමින්

- 2019 වර්ෂය සඳහා රු.750 540.00 වටිනාකමකින් යුතු හරපත්‍ර 59 නිකුත් කර ඇත .
  ඉන් රු .639990.00 ක මුදලක් අයකරගෙන ඇත.
- පෙර වර්ෂ වල නිකුත් කල හරපත්‍ර වලින් 2019 වර්ෂයේ අයකරගත් හරපත්‍ර 3 ක මුදල් රු .75 500.00 කි.

<u>සංස්ථාවට ගෙවීම් පැහැර හැර තිබූ සංස්ථා භාරය හා චිත්‍රපට කුලිය අයකර ගැනීම</u>

- 2019 වර්ෂය තුල රු .5 604 614.74 කි

<u>විදේශ රූගත කිරීම්</u>

විදේශ රට වලින් ශ්‍රී ලංකාවට පැමිණෙන වෙළෙඳ දැන්වීම් චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් රූගත කිරීම් අධීක්ෂණ කටයුතු සිදු කරන ලදී. ඒ අනුව

- 2019 වර්ෂයේ විදේශ රූගත කිරීම් 55 ක් අධීක්ෂණය කර ඇත

- සිනමාශාලා වල තත්ත්වය සොයා බලා ප්‍රවේශ පත්‍ර ගාස්තු සංශෝධනය සඳහා නිර්දේශ ලබා දීම
- සිනමාශාලා 60 ක ප්‍රමාණයක් සඳහා ප්‍රවේශපත්‍ර ගාස්තු සංශෝධනය සඳහා ලබා දී ඇත.

මත්පැන් බලපත්‍ර සඳහා අවශ්‍ය නිශ්කාෂණ ලිපි නිකුත් කිරීම

සිනමාශාලා සඳහා මත්පැන් බලපත්‍ර ලබා දීම සඳහා 2019 වර්ෂයේ නිශ්කාශන ලිපි 35 නිකුත් කරන ලදී.

12. මූල්‍ය කටයුතු

01. ආදායම් ප්‍රභවයන්

2018 - 2019 යන වර්ෂයන්හි සත්‍ය ආදායම හා 2019 වර්ෂයේ අයවැයගත ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම	2018 සත්‍ය රු.මි.	2019 සත්‍ය රු.මි.	අඩුවීම වැඩි / වීම %	2019 අයවැය රු.මි.
බෙදාහැරීමේ කොමිස් දේශීය -	12.9	12.6	(2.3)	32
විදේශීය	11.7	20.6	76.1	
වැඩිවීම (සංස්ථාභාරය)	8.5	7.9	(7.1)	8.5
අධිභාර පරීකෂණ දඩ මුදල් හා වෙනත්	5.6	5.7	1.7	5.5
සිනේඇඩිස් කොමිස්	0.8	0.6	(25)	0.7
චිත්‍රාගාරයේ ආදායම	1.3	1.7	30.8	2.2
වෙළඳ කටයුතු	2.2	1.7	(22.7)	2.1
මෙහෙයුම් ආදායම්	**43.0**	**50.8**	18.0	**51**
වෙනත් ආදායම්	**72.7**	**68.6**	(5.6)	**47.9**
භාණ්ඩාගාරයෙන් ජනාධිපති සම්මාන උළෙල සඳහා-	**-**	**25**	-	**-**
පුනරාවර්තන වියදම් සඳහා ලැබීම්	**63.8**	**80.8**	26.7	**130.4**
මුළු ලැබීම්	**179.5**	**225.2**	25.4	**229.3**

2018ට සාපේක්ෂව සලකා බැලීමේදී මෙහෙයුම් ආදායම 2019දී 2018ට වඩා18% ක වැඩිවීමක්පෙන්වා ඇත. විදේශීය බෙදාහැරීමේ කොමිස් 76.1%ක්ද චිත්‍රාගාරයේ ආදායම 30.8% කින්ද වැඩි වීම මෙහෙයුම් ආදායම වැඩි වීමට බලපා ඇත.

02. වියදම් ප්‍රභව

2018,2019 යන වර්ෂයන්හි සත්‍ය වියදම සහ 2019 වර්ෂයේ අයවැයගත වියදම්පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

වියදම	2018 සත්‍ය රු.මි.	2019 සත්‍ය රු.මි.	අඩුවීම / වැඩි වීම %	2019 අයවැය රු.මි.
සේවක පාරිශ්‍රමික	80.6	90.0	11.7	84.7
ගමන් හා යැපීම් දීමනා	1.4	1.4	-	3
සැපයුම් හා උපකරණ	7.2	9.1	26.3	11.6
අළුත්වැඩියා කිරීම් හා නඩත්තු ක්ෂයවීම්	32.9	30.5	(7.3)	33.8
ජාතික චිත්‍රපට උත්සව	0	26.2	-	32.2
විකුණුම් පිරිවැය	1.8	4.4	144	2.5
ප්‍රවාහන සම්බන්ධතා,අවශ්‍යතා වෙනත්	24.5	29.3	19.6	42.9
බොල් ණය වෙන් කිරීම්	22.2	0.2	(99)	5
පාරිතෝෂික වෙන් කිරීම	7.1	3.5	(50.70)	6.6
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල	0.5	0.5	-	-
මුළු වියදම	178.2	194	9.5	222.3

2018වර්ෂයට සාපේක්ෂව 2019වර්ෂයේ දී වියදම 9.5% කින්වැඩි වී ඇත.එයට ප්‍රධානම හේතුව 2019 වර්ෂයේ ජනාධිපති සම්මාන උළෙල සඳහා රු.මිලියන 26.2 ක්සහ නව සේවකයන් බඳවා ගැනීම නිසා සේවක පාරිශ්‍රමික 11.7% වැඩිවීමට සමගාමීව සියලු වියදම් වල වැඩිවීමක් පෙන්නුම් කිරීමයි.

-

	2018 රු.මි.	**2019** රු.මි.	**%**
මෙහෙයුම් ආදායම	43.0	50.8	18.1
අඩුකළා			
මෙහෙයුම් වියදම	178.2	194.0	8.8
මෙහෙයුම් ලාභය / අලාභය	(135.2)	(143.2)	5.9
එකතුකළා			
වෙනත් ආදායම්	72.7	68.6	(5.7)
වර්ෂයේ ලාභය / අලාභය	(62.5)	(74.6)	19.4
එකතුකළා භාණ්ඩාගාරයෙන් - පුනරාවර්ථන වියදම් සඳහා ලැබීම	63.9	105.8	65.6
අතිරික්තය	1.4	31.2	

2018 ටසාපේක්ෂව 2019වර්ෂයේදී මෙහෙයුම් අලාභය 5.9%කින් වැඩි වී වෙනත් ආදායම5.7% කින් අඩු වුවද 2018වර්ෂයට සාපේක්ෂව 2019වර්ෂයේ අලාභය 19.4% කින් වැඩි වී ඇත.මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේනව සේවකයින් බදවා ගැනීම මත මෙහෙයුම් වියදම් වැඩි වීමයි.පුනරාවර්තන ලැබීම් ගැලපීමෙන් පසුව2019වර්ෂයේ අතිරික්තයරු.මිලියන 31.2 කි.

03. ස්ථාවරවත්කම්

2019 වර්ෂයේදී කාර්යාල උපකරණ හා වායු සමීකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 7.8 ක් ද, සිනමා සංකීර්ණය හා ප්‍රධාන කාර්යාලය අවට භූමි අලංකරණය සඳහා රු.මිලියන 3 ක්ද,චිත්‍රාගාරයටයාන්ත්‍රික උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 4 ක් ද, වැය කර ඇතතවද, බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්න මැඳිරිය සඳහා රු.මිලියන 2 ක් සහ Quick Book ගිණුම්කරණපැකේජය මිලදී ගැනීම සඳහා රු.මිලියන 0.5 ක් ද වැය කර ඇත.2019 වර්ෂයේ ක්ෂය රු.මිලියන 22.2 කි.

04. ජංගම වත්කම්

පසුගිය වර්ෂයට සාපේක්ෂව සලකා බලනවිට ජංගම වත්කම් රු.මි.4.7කින්වැඩි වී ඇත. එසේ වුවද ණයගැති ශේෂයෙන් අයකර ගත නොහැකි පැරණි ණය, බොල්ණය වශයෙන් අඩුකර පෙන්වීම නිසා සමස්ත ණයගැති ශේෂ රු.මිලියන 12 කින් අඩු වී ඇත. 2019 වර්ෂයේදී ආයෝජන කල්පිරීමෙන් පසුවලැබුණු පොලි මුදල නැවත අයෝජනය කිරීම නිසා වර්ෂයේ ආයෝජනය රු.මිලියන 21 කින් වැඩිවි ඇත. මුදල් හා බැංකු ශේෂය රු. මිලියන 12 කින් අඩුවී ඇත.

05. ජංගම වගකීම්

චිත්‍රපට කුලි ණයහිමියන් පසුගිය වර්ෂය සමග සැසඳීමේදි රු.මි.1.95 කින් වැඩිවි ඇත.වෙනත් ණයහිමියන් මිලියන 23 කින් අඩුවී ඇත.

13. සැලසුම්, සංඛ්‍යාලේඛන හා පුහුණු

මෙම අංශයේ ප්‍රමුඛ කාර්යභාරය පහත පරිදි වේ.

- ආයතනික සැලසුම් සකස් කිරීමේ අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැපයීම.
- සංයුක්ත සැලසුම් සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම හා ප්‍රගතිය අධීක්ෂණය
- වාර්ෂික වාර්තා පිළියෙල කිරීම
- මාසික සහ කාර්තුමය ප්‍රගතිය රේඛීය අමාත්‍යාංශය සහ අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- කාර්යමණ්ඩල පුහුණු අවශ්‍යතාවන් හඳුනාගැනීම හා වාර්ෂික පුහුණු සැලසුම් සකස් කිරීම.
- සංස්ථාවට අයත් ගැසට් චක්‍රලේඛ හා වෙනත් සංඛ්‍යාත්මක දත්ත ආදිය එක්රැස්කර පරිගණක දත්ත පද්ධතියක් පවත්වා ගැනීම.

14. වෛද්‍ය සහනාධාර ක්‍රම

සාමාජික මුදල් හා සංස්ථාවෙන් ප්‍රදානය කරනු ලබන මුදල් මත පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සහනාධාර ක්‍රමය මෙම වර්ෂය තුල ද ක්‍රියාත්මක වූ අතර එහි පාලන කමිටුව පහත පරිදි වේ.

- සුධීර නිලංග විතාන මහතා - වැ. බ. සාමාන්‍යාධිකාරී (කමිටු සභාපති)
- නාමල් වීරබාහු මහතා - වැ. බ. සහකාර සාමාන්‍යාධිකාරී - පාලන හා මානව සම්පත්
- කේ. ආර්. වින්සන් මහතා - කමිටු සාමාජික
- සුබිත ඉලංගකෝන් මහතා - කමිටු සාමාජික

15. සුභසාධක සංගමය

සංස්ථා සුභසාධක සකසුරුවම් හා ණයදීමේ සමිතියේ කටයුතු සාමාජික සුභසාධනය වෙනුවෙන් මෙම වර්ෂය තුළ දී ක්‍රියාත්මක විය.

16. බෞද්ධ සංගමය

සංස්ථා සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් සඳහා අවශ්‍ය පොත් ලබා දීම වසර තුළ මූලිකව සිදුකර ඇත.

17. ක්‍රීඩා සංගමය

මේ වසර තුළ ද ක්‍රීඩා සංගමය ක්‍රියාකාරකම්වල නිරතවීය.


18. වෘත්තීය සමිති

ජාතික සේවක සංගමය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, චිත්‍රපට සංස්ථා සේවක සංගමය මෙම වසර තුළදී ද පාලන අධිකාරිය සමග සහයෝගයෙන් කටයුතු කර ඇත.

19. ස්තූතිය


2019 වසරේ සාර්ථක ප්‍රතිපල ලබාගැනීම සඳහා සංස්ථා කාර්යමණ්ඩලය ඉතා වගකීමෙන් හා ධෛර්යයෙන් යුතුව සිය සේවාවන් ඉටුකර ඇත.

එම සේවාවන් අධ්‍යක්ෂ මණ්ඩලය ඉමහත් සේ අගය කරන අතර ඔවුන් වෙත සිය ස්තූතිය කෘතවේදීව පල කර සිටිමි.



ජී. ඒ. කිත්සිරි
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව



මූල්‍ය ප්‍රකාශන

2019

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2019.12.31 දිනට අවසන් වර්ෂය සඳහා

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

විස්තරය	සටහන		2019 රු.	2018 රු.
විකුණුම්	03		50,800,475	43,078,671
අඩු කළා : විකුණුම් පිරිවැය	04		(4,424,231)	(1,804,339)
දළ ලාභය			46,376,244	41,274,332
අඩු කළා : වියදම්				
සේවක පාරිශ්‍රමික	05		(89,929,560)	(80,615,419)
ගමන් හා යැපීම් දීමනා	06		(1,386,049)	(1,389,173)
සැපයුම් හා උපකරණ	07		(9,142,609)	(7,198,155)
අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම්	08		(30,475,643)	(32,937,727)
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා	09		(29,373,187)	(24,480,563)
බොල් ණය සඳහා හානිකරන ගැලපීම්	16-A		(210,041)	(22,190,423)
පාරිතෝෂික වෙන් කිරීම්			(3,486,140)	(7,131,374)
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා වෙන් කිරීම්			(500,000)	(500,000)
			(164,503,230)	(176,442,835)
මෙහෙයුම් ලාභය / අලාභය			(118,126,986)	(135,168,503)
එකතු කළා :				
වෙනත් ආදායම්	10	15,737,276		
ස්ථාවර හා භාණ්ඩාගාර බිල් පොළී		27,615,541		
භාණ්ඩාගාර ලැබීම් ආධායමට හඳුනා ගැනීම්		17,021,778		
224 ගොඩනැගිලි කුලී		8,238,000		
		68,612,595	68,612,595	72,720,747
වසරේ ලාභය /අලාභය			(49,514,391)	(62,447,756)
එකතු කළා : භාණ්ඩාගාර ලැබීම්			80,750,000	63,850,000
බදු පෙර ලාභය			31,235,609	1,402,245
අඩු කළා : බදු සඳහා වෙන් කිරීම්				
ඌනතාවය / අතිරික්තය			31,235,609	1,402,245

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	2019 රු.	2018 රු.
නියෝජනය වන්නේ			
ස්ථාවර වත්කම්			
දේපල , යන්ත්‍ර සුත්‍ර හා උපකරණ	11	330,003,870	339,841,802
දිගු කාලීන ආයෝජන	12	23,590,724	21,588,312
		353,594,595	361,430,114
ජංගම වත්කම්			
කෙටි කාලීන ආයෝජන	13	315,230,612	295,820,920
තොග	14	6,303,556	6,050,331
ණයගැතියෝ	15	117,087,522	127,374,293
විවිධ ණයගැතියෝ	16	189,353,380	190,736,133
තැන්පතු හා ඉදිරි ගෙවීම්	17	3,631,673	3,877,434
මුදල් හා බැංකු ශේෂය	18	23,541,601	35,948,047
		655,148,343	659,807,157
මුළු වත්කම්		1,008,742,937	1,021,237,270
යෙදවූ ප්‍රාග්ධනය			
අනුදත් ප්‍රාග්ධනය		10,000,000	10,000,000
සමුච්චිත ලාභය		415,669,539	385,259,178
වෙනත් සංචිත		134,282,759	134,282,759
		559,952,299	529,541,937
ජංගම නොවන වගකීම්			
ප්‍රදානයන්	19	87,160,132	104,181,910
පාරිතෝෂික වෙන් කිරීම්	20	42,365,554	43,151,056
		129,525,686	147,332,966
එකතු කළා : ජංගම වගකීම්			
තැන්පතු	21	3,256,525	2,969,499
චිත්‍රපට කුලී ණයහිමියෝ	22	251,146,803	253,098,466
වෙනත් ණයහිමියෝ	23	64,861,624	88,294,402
		319,264,953	344,362,367
මුළු වගකීම්		1,008,742,937	1,021,237,270

පිටු අංක 05 සිට 21 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 22 සිට 36 දක්වා ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය කොටසකි. මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් කර ඇත

.....
වැ.බ. සහකාර සාමාන්‍යාධිකාරී -ආදායම්
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව ,
303 , බෞද්ධාලෝක මාවත ,
කොළඹ 07.
2020.07.03

....
සභාපති අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	හිමිකම් ප්‍රාග්ධනය රු.	සමුච්චිත ලාභය රු.	ප්‍රාග්ධන සංචිත රු.	ප්‍රත්‍යාගණන සංචිත රු.	වෙනත් සංචිත රු.	එකතුව රු.
2018.01.01 දිනට ශේෂය	10,000,000	383,856,933	499,898	115,153,399	7,829,462	517,339,692
වසරේ ලාභය	-	1,402,245	-	10,800,000	-	12,202,245
2018.12.31 දිනට ශේෂය	10,000,000	385,259,178	499,898	125,953,399	7,829,462	529,541,937
පසුගිය වසරට ගැලපීම්		(825,248)				
වසරේ ලාභය	-	31,235,609	-	-	-	31,235,609
2019.12.31 දිනට ශේෂය	**10,000,000**	**415,669,539**	**499,898**	**125,953,399**	**7,829,462**	**560,777,546**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2019	2018
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්	රු.	රු.
බදු අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය	(49,514,391)	(62,447,755)
(අඩු කළා)		
නිෂ්පාදන ණය මත පොළිය	(5,761)	(2,163,409)
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය	(27,615,541)	(25,428,638)
	(77,135,693)	(90,039,802)
මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයයන් සඳහා ගැලපීම		
ක්ෂයවීම්	22,293,932	25,755,076
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,983,291	7,131,374
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනනය	-	10,800,000
අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන	-	22,190,423
රාජ්‍ය ප්‍රදානයන් ආදායමට හඳුනා ගැනීම	(17,021,778)	(20,168,009)
භාණ්ඩාගාර ලැබීම්-ජනාධිපති සම්මාන උළෙල	(20,000,000)	-
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනයය කිරීමේ ගැලපීම්	-	6
ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ ලාභය	-	(50,249)
	(87,880,247)	(44,381,181)
ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන්		
ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන් සඳහා ගැලපීම	5,268,690	(35,339,836)
කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	(82,611,557)	(79,721,017)
කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම්		
තොගය (අඩුවීම)	(253,225)	(647,646)
ණයගැතියෝ (අඩුවීම)	11,669,524	(47,218,937)
තැන්පතු හා ඉදිරි ගෙවීම් (අඩුවීම)	245,761	37,989
තැන්පතු වගකීම (වැඩිවීම)	287,027	85,272
ණයහිමියෝ (අඩුවීම)	(1,951,663)	(5,834,582)
වෙනත් ණයහිමියෝ (අඩුවීම)	(23,432,778)	41,494,610
	(96,046,911)	(91,804,311)
අඩු කළා :		
පාරිතෝෂික ගෙවීම්	(4,768,794)	(4,208,523)
	(100,815,704)	(96,012,834)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
නිෂ්පාදන ණය පොලී	5,761	2,163,409
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය	27,615,541	25,428,638
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	(18,549,939)	(25,619,946)
භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ආයෝජනය	(21,412,105)	(24,500,438)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබූ මුදල්	-	50,250
භාණ්ඩාගාර ලැබීම්	100,750,000	63,850,000
මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශුද්ධ වැඩිවීම් (අඩුවීම)	(12,406,446)	(54,640,921)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය	35,948,047	90,588,968
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය	23,541,601	35,948,047

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය

මුල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය

සංස්ථාවේ කළමනාකරණය ,

1. සංස්ථාවේ ආදායම සහ වියදම වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියළු මුල්‍ය ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීම පිළිබඳව,

2. සංස්ථාවේ මුල්‍ය ක්‍රියාකාරීත්වය හා මුල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ ඉදිරිපත් කිරීමක් සඳහා, 1995 අංක.15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කිරීම පිළිබඳව හා

3. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට හා වංචා සහ විෂමතා වැලැක්වීම සඳහා උචිත පියවර ගැනීම පිළිබඳව වගකිව යුතු වන්නේය.

1. <u>පොදු තොරතුරු</u>

1.1.1 <u>පිහිටීම හා නීතිමය තත්ත්වය</u>

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව 1971 අංක.47 දරන පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කොට පිහිටුවන ලදී. එහි ලියාපදිංචි කාර්යාලය , කොළඹ 07 , බෞද්ධාලෝක මාවතේ අංක.303 දරන ස්ථානයෙහි පිහිටියේය.

1.1.2<u>මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වරූපය</u>

ශ්‍රී ලාංකේය සිනමාවේ දේශීය අනන්‍යතාව ජාත්‍යන්තරයේ සනිටුහන් කල හැකි ගුණාත්මක සිනමා සංස්කෘතියක් ඇති කිරීමේ පුරෝගාමියා බවට පත්ව සිටී.

1.1.3 <u>නිකුත් කිරීම සඳහා අනුමත කළ දිනය</u>

මෙම මූල්‍ය ප්‍රකාශනයන් බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020.07.03 දින අනුමැතිය දෙන ලදී.

1.2<u>ගිණුම් පිළියෙල කිරීමේ පදනම</u>

1.2.1<u>අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය</u>

සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහිත සටහන් (මූල්‍ය ප්‍රකාශන) සකස් කරන ලද්දේ, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය මඟින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) නියෝජනය වන පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූල වන පරිද්දෙනි.

1.2.2<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම</u>

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ කළමනාකරිත්වය විසින් දරනු ලැබේ.

1.2.3ගිණුම්කරණ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් උචිත හෙළිදරව් කිරීමක් කර ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කොට සකස් කර ඇත.

1.2.4අඛණ්ඩතාව

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කළමනාකරණය විසින් සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇත. සංස්ථාව , එහි මෙහෙයුම් පෙනෙන අනාගත කාලය තුළදී පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් සම්පත් තිබෙන බව විශ්වාසනීයව අපේක්ෂා කරයි. තිබෙන්නා වූ සියලු තොරතුරු සැලකිල්ලට ගත් විට ඉදිරියේදී සංස්ථාව ඈවර කිරීමට හෝ එහි මෙහෙයුම් නතර කිරීමට හේතුවක් නොපෙනෙන අතර , අඛණ්ඩව පවත්නා ආයතනයක් සේ සලකා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.2.5ක්‍රියාත්මක වීමේ හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

සංස්ථාවේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

1.2.6වැදගත් වන ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපලේඛන

වාර්තා කරන දිනයේදී වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම පිළිබඳව වාර්තා කරන ලද සංඛ්‍යාවන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් කිරීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට අවශ්‍ය වේ. කෙසේ වුවද, මෙම උපකල්පනයන්ගේ හා ඇස්තමේන්තු වල තිබෙන්නා වූ අවිනිශ්චිතභාවය හේතුවෙන් අනාගතයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම් වල සැලකිය යුතු ගැලපීම් කිරීමට අවශ්‍ය වන්නා වූ බලපෑම් ඇතිවිය හැකිය. මෙම කාරණයන්හි විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් ඇතුළත් විය හැකිය.

ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම්හි සැලකිය යුතු ගැලපීම් කිරීමට සිදු වන්නා වූ, විශේෂිත අවදානම් ඇතිවිය හැකි, වාර්තා කරන දිනට පැවති අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පනයන් හා ඇස්තමේන්තු මූලාශ්‍රයන් පහත දක්වා ඇත.

(අ)මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය

ශේෂ පත්‍රයෙහි වාර්තා කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳ පොලේ ව්‍යුත්පන්න විය නොහැකි අතර, ඒවා වට්ටම් කළ මූල්‍ය ප්‍රවාහනයන් සහ / හෝ ගණිතමය ආකෘති ඇතුළු ශිල්ප ක්‍රම භාවිතා කරමින් නිශ්චය කර ඇත. මෙම ආකෘති වල යෙදවුම්, හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළෙඳ පොල දත්තයන්ද එවැනි දෑ නොමැති විට විනිශ්චය කිරීමෙන්ම ලබා ගන්නා ලදී.

මෙම සාධකයන් පිළිබඳ උපකල්පනයන්හි වෙනස්වීම් වාර්තා කර ඇති මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය කෙරෙහි බලපෑ හැකිය.

(ආ)සාධාරණ අගය

සාධාරණ අගය යනු දැනුමක් හා කැමැත්තක් ඇති පාර්ශව අතර අතේ දූරින් සිදු වූ ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කළ හැකි අගයයි. මූල්‍ය සාධන පත්‍රයක් මුලින්ම හඳුනා ගැනීමේදී එහි සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් ගැනෙන්නේ ලැබූ හෝ ගෙවූ වටිනාකමයි. පසුකාලීනව මූල්‍ය වත්කමක සාධාරණ අගය වන්නේ සක්‍රීය වෙළඳපොලක ඉල්ලුම් කෙරෙන ලංසු තබන මිළයි. මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ඉල්ලුම් කරන මිළයි. මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන සඳහා පවත්නා අගය වන්නේ සාධාරණ මිළයි.

2.විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම-

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මුදල් හා බැංකු ශේෂයන් සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී හෝ වර්ෂයක් තුළ හෝ යන දෙකින් අඩු කාල සීමාවේදී මුදල් බවට උපලබ්ධි වන ඒවාය.

2.2මූල්‍ය සාධන පත්‍ර

2.2.1මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

මූල්‍ය වත්කම් පහත සඳහන් කොටස් වලට වර්ගීකරණය කෙරේ. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කළ දෑ, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරෙන තුරු හෝ විකිණීමට තිබෙන දෑ , මෙම වර්ගීකරණය කළමනාකරණය විසින් නීර්ණය කරන ලද්දේ මූලික හඳුනා ගැනීම හා එම ආයෝජන අත්පත් කර ගැනීමේ අරමුණ පදනම් කොට ගෙනය.

2.2.2වර්ගීකරණය , හඳුනා ගැනීම සහ මැනීම.

කළමනාකරණය විසින් එහි මූල්‍ය වත්කම් පහත සඳහන් ලෙස වර්ගීකරණය කරයි.

අ. ණය සහ ලැබිය යුතු දෑ

ආ. විකිණීම සඳහා ඇති දෑ

අ. ණය සහ ලැබිය යුතු දෑ

ස්ථාවර හෝ සක්‍රීය වෙළෙඳපොලේ මිළ ප්‍රකාශ නොවන, තීරණය වූ ගෙවීම් සහිත මූල්‍ය වත්කම්ය. මෙම වත්කම් මුලින්ම සාධාරණ වටිනාකමට එකතු වූ සෘජුවම අදාල වන ගණුදෙනු පිරිවැය හඳුනා ගනු ලැබේ. පසුකාලීනව ණය සහ ලැබිය යුතු දෑ සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය කිරීමත් , යම් හානිකරණ පාඩුවක් වේනම් එයත් සැලකිල්ලට ගෙන මනිනු ලැබේ.

ආ. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු නිශ්චිත නොවූ කාල පරිච්ඡේදයක් තබා ගැනීමට අදහස් කරන , ද්‍රවශීලතා හේතු හෝ පොලී අනුපාත වෙනස්වීම මත , විනිමය අනුපාත වෙනස්වීම මත හෝ ස්කන්ධ මිළ මත විකිණීමට අවශ්‍ය විය හැකි හෝ ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර නොමැති කල් පිරෙන තුරු තබා ගන්නා හෝ ලාභ හෝ අලාභ මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්ය.

2.2.3<u>සාධාරණ අගය නිශ්චය කිරීම.</u>

ණය සහ අත්තිකාරම් මෙන්ම වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීමේදී වර්තමාන අගය ආකෘතිය එකඟ වූ මුදල් ප්‍රවාහයන් පදනම් කොට ගෙන ණයෙහි ගුණාත්මකභාවයද , ද්‍රවශීලතාව හා පිරිවැයද සැලකිල්ලට ගෙන නිර්ණය කෙරේ. වෙළෙඳ ලැබිය යුතු හා ගෙවිය යුතු අයිතම වල ආසන්න සාධාරණ අගය ලෙස සැලකෙන්නේ පවත්නා වටිනාකමින් හානිකරණය සඳහා අඩු කළ පසු ඉතිරියයි.

2.2.4<u>ප්‍රති වර්ගීකරණය</u>

ණය හා ලැබිය යුතු දෑහැර මූල්‍ය වත්කම් , වෙලදාම සඳහා අයිතමයන්ගෙන් වෙන් කොට වර්ගීකරණය කිරීමට ඉතා කලාතුරකින් ඇතිවිය හැකි පරිසරයකදී හුදෙකලා සිදුවීමක් ලෙස අවසර දෙනු ලැබේ. ණය සහ ලැබිය යුතු දෑ අතරින් වෙලදාම සඳහා වූ දේ ලෙස ප්‍රති වර්ගීකරණය කිරීම සංස්ථාව විසින් ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයට අදාළ වන්නේනම් ප්‍රතිවර්ගීකරණය තොරා ගනු ඇත.

ප්‍රතිවර්ගීකරණය කරනු ලබන්නේ එසේ කරන දිනට ඇති සාධාරණ අගයටයි. සාධාරණ අගය වන්නේ නව පිරිවැය හෝ ක්‍රමක්ෂය පිරිවැය මතය.

2.2.5<u>හානිකරණය</u>

(අ)<u>ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන මූල්‍ය වත්කම්</u>

එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වී ඇති බවට වන සාක්ෂි සංස්ථාව විසින් අගය කෙරේ. වත්කමෙහි ආරම්භක හඳුනා ගැනීමෙන් පසු ඇති වූ අවස්ථා එකක හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස (දරන ලද අලාභ අවස්ථා) අගය අඩුවීමක පරමාර්ථ සාක්ෂියක් තිබේනම් සහ එම අලාභ අවස්ථාවට මූල්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ හෝ විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තුගත කළ හැකි මූල්‍ය වත්කම්කාණ්ඩයක් මත බලපෑමක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වූ බවට සලකනු ලැබේ. අගය අඩුවන බවට වන සාක්ෂි ලෙස, ණයකරුවෙකු හෝ ණයකරුවන් කාණ්ඩයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා වලට මුහුණ දෙමින් සිටින බව පෙන්වීම, පොළියෙහි හෝ මූලධන ගෙවීම් වල පැහැර හැරීම්, ඔවුන් බංකොලොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඇති හැකියාව සහ පැහැර හැරීම් සමඟ සහසම්බන්ධිත ආර්ථික තත්ත්ව හෝ හිඟ මුදල් වල වෙනස්වීම් වැනි

ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල ඇඟයිය හැකි අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි දත්ත මින් පෙන්වීම , ඇතුළත් විය හැකි වේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් සඳහා, තනි තනි වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනි වශයෙන් අගය අඩුවීම්හි පරමාර්ථ සාක්ෂි තිබේදැයි සංස්ථාව විසින් පළමුවෙන් තනි තනි වශයෙන් අගයන අතර, තනි තනි වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමුහිකව අගයයි. වැදගත් වුවත්, නොවුවත් තනි තනි වශයෙන් අගයනු ලැබූ මූල්‍ය වත්කමක අගය අඩුවීම පිළිබඳ පරමාර්ථසාක්ෂියක් නොමැති බව සමුහය විසින් නිශ්චය කළහොත් එය, එම වත්කම සමාන බැර අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩයක ඇතුළත් කරන අතර ඒවා අගය අඩුවීම සඳහා සාමුහිකව අගයනු ලැබේ. අගය අඩුවීම සඳහා තනි තනි වශයෙන් අඟයනු ලැබූ සහ අගය අඩුවීමක් සහිත හෝ දිගින් දිගටම හඳුනා ගැනීමට නියමිත වත්කම් අගය අඩුවීමෙහි සාමුහික ඇගයීමට ඇතුළත් කරනු නොලැබේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ වත්කම් මත අගය අඩුවීමේ අලාභදරා ඇති බවට පරමාර්ථ සාක්ෂියක් ඇති විට , වත්කමෙහි පවතින වටිනාකම සහ මූල්‍ය වත්කමෙහි මුල් ඵලදායී පොළි අනුපාතිකයට වට්ටම්ගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල වර්තමාන වටිනාකම (නොදරන ලද අනපේක්ෂිත අනාගත ණය අලාභ හැර) අතර වෙනසින් අලාභයෙහි ප්‍රමාණය අගයනු ලැබේ. ණයක් සඳහා වෙනස් වන පොළි අනුපාතියක් පවතීනම් යම් අගය අඩුවීමේ අලාභයක් ඇගයීම සඳහා වට්ටම්ගත අනුපාතය වන්නේ වර්තමාන ඵලදායී පොළී අනුපාතයයි. වත්කමෙහි පවතින වටිනාකම දීමනා ගිණුමක් භාවිතා කිරීම හරහා අඩු වන අතර , හානිවන ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. පොළී ආදායම . අඩු වූ පවතින වටිනාකම මත එක්රැස් වීම පවත්වා ගෙන යනු ලබන අතර එය අගය අඩු වීමේ අලාභ ඇගයීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම්ගත කළ පොළී අනුපාතය භාවිතා කරමින් එක් රැස් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයෙහි ආයෝජන ආදායම් වල කොටසක් ලෙස පොළී ආදායම වාර්තා කරනු ලැබේ.අනාගත අය කර ගැනීමෙහි තාත්වික අපේක්ෂාවන් නොමැති විට ආශ්‍රිත දීමනා සමඟින් ණය කපා හරිනු ලබන අතර , සියලු සුරැකුම් සමුහයට උපලබ්ධි කර හෝ පවරාගෙන ඇත. ආසන්න වර්ෂයකදී අගය අඩුවීම හඳුනා ගැනීමෙන් පසු යම් හේතුවක් නිසා ඇස්තමේන්තුගත අගය අඩුවීමේ අලාභය වැඩි වේ නම් හෝ අඩු වේනම් දීමනා ප්‍රමාණය සීරුමාරු කර පෙර හඳුනා ගනු ලැබූ අගය අඩුවීමේ අලාභය වැඩි හෝ අඩු කරනු ලැබේ. අනාගත කපා හැරීමක් පසුව අය කර ගතහොත් එම අය කිරීම ආදායම් ප්‍රකාශනයෙහි දීමනා (Allowance) ගිණුමට ගලපනු ලැබේ.

(ආ) අනෙකුත් මූල්‍යමය නොවන වත්කම් හානිකරණය

වත්කමක පවත්නා අගය අය කර ගත නොහැකි බව පෙනෙන පරිසරයකදී හානිකරණය සඳහා විමසා බැලීමට යටත් වේ. පවතින වටිනාකමඑහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අඟය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ.

2.2.6හඳුනා ගැනීම අත් හැරීම.

මූල්‍ය වත්කමක් (හෝ කොටසක් හෝ සමුහයක කොටසක් ඇතුලුව) හඳුනා ගැනීම අත් හරින අවස්ථා මෙසේය.

- මූල්‍ය ප්‍රවාහයන් ලැබීමේ අයිතිය ඉකුත් වීම.
- සංස්ථාව විසින් වත්කම මඟින් මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය පැවරීම හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් තුන්වන පාර්ශවයකට පවරා දිය යුතු යැයි උපකල්පනය කිරීම.

(අ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීම.
(ආ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීමක් හෝ රඳවා ගැනීමක් නොකොට පාලන අයිතිය පැවරීම.

2.2.7නීතිමය අයිතියක් ඇති අවස්ථා වල මූල්‍ය වත්කම් හා වගකීම් සමාහරණය කොට ශුද්ධ අගය දක්වා ඇත.

2.3.<u>දේපළ , යන්ත්‍ර හා උපකරණ</u>

2.3.1<u>හඳුනා ගැනීම හා මැනීම.</u>

දේපළ , යන්ත්‍ර හා උපකරණ අයිතමයන් ඒවායේ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ තක්සේරු අගයට පෙන්වා ඇත. පිරිවැය තුළවත්කම අත් කර ගැනීමේදී දැරූ වියදම් වලින් සෘජුවම අදාල වන වියදම් ඇතුලත් වේ. ස්වයං නිර්මිත වත්කම් වල එම වත්කම් භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දැරූ ද්‍රව්‍යය පිරිවැය , සෘජු ශ්‍රමය , සෘජුවම බලපාන වෙනත් අදාල වියදම් ඇතුළත් වේ. අළුත්වැඩියා හා ඉදිරි අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ වෙනුවෙන් දරන ලද වියදම් ඒවා දරන අවස්ථාවේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

2.3.2<u>පසුකාලීන පිරිවැය</u>

උපාංග ප්‍රතිපූර්ණය සඳහා දරන ලද වියදම වෙන් වෙන්ව එනම් පුළුල් පරීක්ෂාවන් හා පූර්ණ අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනගත කෙරෙන්නේ ඒවායේ ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හේතු වන්නේනම් හා එම ප්‍රතිලාභ විශ්වාසදායකව මැනිය හැකි නම්ය. දෛනික සේවා කිරීම් ඒවා දරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

2.3.3<u>ක්ෂය වීම්</u>

ක්ෂය සඳහා වෙන් කිරීම සරල මාර්ගක්‍රමය අනුව පිරිවැය/තක්සේරු අගය මත ගණනය කෙරේ. ඉඩම් හැර දේපළ , යන්ත්‍ර හා උපකරණ පහත දැක්වෙන ප්‍රතිශත අනුව ප්‍රයෝජනවත් ආයු කාලය තුළදී ශේෂය ගණනය කෙරේ.

ගොඩනැඟිලි	-	ප්‍රධාන කාර්යාලය	2.5%
	-	ශ්‍රවණාගාරය	5%
චිත්‍රපට සංකීර්ණය	-	ගොඩනැඟිලි	5%
	-	අනෙකුත් යන්ත්‍ර සූත්‍ර	10%
ලී බඩු සවි කිරීම්			25%
මෝටර් රථ			25%
චිත්‍රපට සංරක්ෂණාගාරය			10%
සංස්කෘතික / අධ්‍යාපනික / චිත්‍රපට උපකරණ			10%
චිත්‍රපට උපකරණ			10%
සුභසාධන උපකරණ			10%

දේපළ පිරියත හා උපකරණ මිළදී ගත් දිනෙන් ආරම්භව ක්ෂය කරනු ලැබේ.

2.3.4<u>හඳුනා ගැනීම ඉවත් කිරීම.</u>

දේපළ , පිරියත සහ උපකරණ අයිතමයක පවතින වටිනාකම අපහරණයකදී හෝ ඒවායින් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීම නතර වේ. දේපළ , පිරියත හා උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය හඳුනා නොගන්නා විට අදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කරනු ලැබේ.

2.3.5 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීමක කිසියම් ඇගවීමක් තිබේදැයි නිශ්චය කිරීම සඳහා විලම්භීත බදු වත්කම් හාර සමුහයෙහි මූල්‍යමය නොවන වත්කම් වල පවතින වටිනාකම් ඒ ඒ වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලැබේ. එවැනි තත්ත්වයක් ඇත්නම් , එවිට වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. අවිනිශ්චිත ඵලදායි ආයු කාලයක් සහිත හෝ මේ වන තෙක් භාවිතය සඳහා නොපවතින අස්පෘශ්‍ය වත්කම් සඳහා අය කර ගත හැකි වටිනාකම එක් එක් වර්ෂයේදී එම අවස්ථාවේදීම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහිසාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ. භාවිතයේ ඇති වටිනාකම (Value in use) ඇගයීමේදී , මුදලෙහි කාලීන අගයෙහි වර්තමාන වෙළෙඳපොල ඇගයීම පිළිබිඹු කරනු ලබන බදු පෙර වට්ටම් අනුපාතයක් සහ වත්කමට හෝ මූල්‍ය උත්පාදක ඒකකයට විශේෂිත අවදානම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ.

අගය අඩුවීම පරීක්ෂා කිරීමේ අරමුණ සඳහා තනි තනිව පරීක්ෂා කළ නොහැකි වත්කම් වෙනත් වත්කම් වලින් මුදල් ගැලීමෙන් විශාල වශයෙන් නිදහස් වන නොකඩවා පාවිච්චියෙන් මුදල් ගැලීම උත්පාදනය කරනු ලබන කුඩාම වත්කම් කාණ්ඩයකට කාණ්ඩගත කරනු ලැබේ. අගය අඩුවීමේ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

2.4තොග

සියළු තොග පිරිවැය හෝ ශුද්ධ ප්‍රත්‍යාගණන අගය යන දෙකින් අවමයට අගය කෙරේ. පිරිවැය පළමු ඇතුළු - පළමු පිට (FIFO) ක්‍රමය පදනම් කොටගෙන තීරණය කෙරේ.

2.5ආදායම් බදු

සංස්ථා සේවකයන්ගේ පඩි හා අනෙකුත් දීමනාද , වියදම් වලින් කොටසක් පියවීම සඳහාද , භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙනු ලැබේ. භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් සඳහා බදු නොගෙවිය යුතුය යන පදනම මත බදු ගෙවීම සඳහා වෙන් කිරීමක් කර නොමැත.

සංස්ථාව විසින් වාර්ෂිකව ලැබූ ලාභය ආදායම් බදු ගෙවීමෙන් පසු ඇති වූ අතිරික්තයෙන් 24% ක ප්‍රමාණයක් ලාභය වෙනුවෙන් බදු ගෙවිය යුතුය යන්න අපගේ මතය වන අතර , එම ප්‍රමාණය විය යුත්තේ ආදායම් බදු සඳහා සිදු කළ ගැලපුම් කටයුතු වලින් පසු ඉතිරි ශුද්ධ ලාභය යන්න අපගේ විශ්වාසයයි.

2.6 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් වල අනෙකුත් ණයගැතියන් සහ ලැබිය යුතු දෑ, අත්තිකාරම්, තැන්පතු, කලින් ගෙවීම්, ලැබිය යුතු බදු ඇතුළත් වේ.

(අ) අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවූ වියදම්

එක් මුදල් වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ප්‍රතිලාභ ලැබෙතැයි පෙනෙන යම් සම්බන්ධතාවයක්ඇති වියදම් අත්තිකාරම් , තැන්පතු හා කලින් ගෙවූ වියදම් ලෙස වර්ගීකරණය කරන ලදී. එවැනි වියදම් කාල පදනම මත අදාළ කාල පරිච්ඡේදය තුළ කපා හරිනු ලැබේ.

(ආ) අනෙකුත් ණයගැතියෝ

අනෙකුත් ණයගැතියන් පිරිවැයෙන් හානිකරණය අඩු කළ වටිනාකමට හඳුනාගෙන ඇත.

2.7මුදල් සහ මුදල් හා සමාන දෑ

ඒවායේ සාධාරණ අගයෙහි වෙනස්වීමට නොසැලකිය යුතු තරමේ අවදානමකට භාජනය වන අත්පත් කර ගත් දින සිට මාස 03 ක් කල් පිරුණු හෝ ඊට අඩු කල් පිරීමක් සහිත සහ සමුහය විසින් එහි කෙටිකාලීන වගකීම් කළමනාකරණය සඳහා යොදා ගන්නා මුදල් ශේෂ සහ ඉල්ලුම් තැන්පතු වලින් මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වේ.

2.8මූල්‍ය වගකීම්

2.8.1ආරම්භක හඳුනා ගැනීම හා මැනීම.

LKAS 39 අනුව මූල්‍ය වගකීම් වර්ග කොට ඇත්තේ , උචිත පරිදි ලාභය හෝ අලාභය මඟින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම් හෝ ණය හෝ ණයට ගැනීම්ය. සංස්ථාව එහි මූල්‍ය වගකීම් ආරම්භක හඳුනා ගැනීම අනුව වර්ගීකරණය නිශ්චය කර ඇත. සියළු මූල්‍ය වගකීම් මුලින්ම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර , ණය හා ණය ගැනුම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය ක්‍රමය භාවිතා කරයි. මෙහි සෘජුවම අදාළ වන ගනුදෙනු පිරිවැය ඇතුළත්ය.

සංස්ථාවේ මූල්‍ය වගකීම් වල වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුලත්ය.

2.8.2 පසුකාලීන මිනුම්

මූල්‍ය වගකීම් මිනුම පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

2.8.3ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් වල වෙළඳාම සඳහා වූ මූල්‍ය වගකීම් සහ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් මත නම් කරන ලද ඒවා ඇතුළත් වේ. මූල්‍ය වගකීම් , වෙළඳාම සඳහා පවත්නා දේ ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ ඒවා නුදුරේදී විකිණීමේ අරමුණ ඇත්නම්ය. වෙළඳාම සඳහා වගකීම් මත ලැබීම් හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. සංස්ථාව කිසිදු මූල්‍ය වගකීමක් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මුලික හඳුනා ගැනීම නම් කර නැත.

2.9අනෙකුත් මූල්‍ය වගකීම්

ණය සහ ණය ගැනුම් ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අනෙකුත් මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ක්‍රමාක්ෂය ක්‍රමය භාවිතා කරයි.

උපචිත වියදම්	රු
ගෙවීමට ඇති වැටුප් හා වෙනත්	28,885,776
හිඟ ඊ.පී.එප් -22896857	
හිඟ ඊ.ටී.එප් -3126657	
ගෙවීමට ඇති වැටුප -2862262	
වෙනත් වියදම්	16,054,782
අන්තර් ජාල පහසුකම් සැපයීම	1,357,000
	46,297,558

2.10අනෙකුත් වගකීම්

අනෙකුත් වගකීම් වල උපචිත වියදම් ද ඇතුලත්ය. මේවා ඒවායේ සාධාරණ අගය ලෙස වටිනාකමට දක්වා ඇත.

රූගතකිරීම් අධීක්ෂණාගාස්තු

රූගත කිරීම් යටතේ වෙළඳ දැන්වීමක් රූගත කිරීමේදී ඇති වූ ගැටළුකාරී තත්ත්වයක් මත අය කරන ලද රුපියල් ලක්ෂ 5 ක මුදල වෙනුවෙන් නඩු නිමිත්තක් පවතින නිසා එම මුදල විවිධ ණයහිමියන් යටතේ වෙන් කරන ලදී.

2.11 රජයේ ප්‍රදාන

වත්කම් වලට අදාළ රජයේ ප්‍රදාන මේවා ශේෂ පත්‍රයේ විලම්භනය කර අදාළ වත්කමේ ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබන අතර , වියදම් පියවීම සඳහා ලැබෙන්නා වූ ලැබීම් , ලැබීම් පදනම මත ගිණුම්ගත කෙරේ.

භාණ්ඩාගාර ප්‍රදානයන් භාවිතය සමඟ නිසි පරිදි ආදායමට හඳුනා ගැනීම.

LKAS 20 අනුව වත්කම් ගොඩනැගීමට අදාලව රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් වත්කමෙහි ආයු කාලය පුරා ආදායමට හඳුනා ගැනීම 2019වර්ෂයට හඳුනා ගත් ආදායම් පහත සඳහන් වේ.

		රු.ශත
නව ගොඩනැගිල්ල	-	1,308,864.03
සිනමා සංකීර්ණය	-	5,871,317.70
ප්‍රධාන කාර්යාලය	-	4,251,471.57
චිත්‍රාගාර යන්ත්‍රසූත්‍ර	-	5,173,074.56
අන්තර් ජාල පහසුකම්	-	135,700.00
ලී බඩු	-	281,350.33
		17,021,778.19

ආයතනයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු මුදල - **රු.80,750,000**

2.12සේවක ප්‍රතිලාභ

නිර්ණය කළ දායක සැලැස්ම

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි ප්‍රකාර , සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයෝ හිමිකම් ලබති. සංස්ථාව විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත ස්ථාවර දායකයක් මෙකී අරමුදල් වලට ගෙවන අතර , ඉන් අමතරව නීතිමය හෝ හෝ අර්ථකාරී බැඳීමක් සංස්ථාව කෙරෙහි නොමැත.

නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමකට වෙනස් වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැලසුමක් වේ. මේ සම්බන්ධව 1983 අංක.12 දරන පාරිතෝෂික පනත යටතේ සංස්ථාව බැඳී සිටී.

2.13ආදායම

2.13.1 නිෂ්පාදක ණය පොලිය හා අධි භාරය

නිෂ්පාදකයින් වෙත ලබා දී ඇති ණය මුදල් සඳහා පොළිය ගිණුම්ගත කර ඇත්තේ අදාළ චිත්‍රපට ප්‍රදර්ශනය වී අවුරුද්දක් ගත වන තෙක් පමණි. යම් අවස්ථාවක ණය මුදල් සම්පූර්ණ අය වන්නේනම් අදාල පොලියද ගණනය කර අය කිරීමට කටයුතු කරනු ලැබේ.

සිනමාශාලා වලින් අය වීමට ඇති මුදල් සඳහා ගැසට් නිවේදනයේ පරිදි අධිභාරය ගණනය කර ගිණුම්ගත කර තිබේ.

2019 වසර තුලදී චිත්‍රපට නිශ්පාදනය සඳහා ණය ලබා දීම අඩු වීම හේතුවෙන් නිශ්පාදන ණය පොලිය අඩු වී තිබේ.

2.13.2 ප්‍රදර්ශනය සඳහා මුදා හැර ඇති චිත්‍රපට

චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේදී ආදායම නොලැබීම මත ණය මුදල් අය නොවීමේ තත්ත්වයක් තුළ චිත්‍රපට මුදා හැර වසරකට පසු පොළිය ගිණුම්ගත කරනු නොලැබේ.

2.13.3 ප්‍රදර්ශනය නොවූ චිත්‍රපට

(අ)චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබා දී ඇති එහෙත් පසුගිය වර්ෂ දෙකක සේවාවන් ලබාගෙන නොමැති චිත්‍රපට වලට පොළගිය ගිණුම්ගත කර නොමැත.

(ආ)චිත්‍රාගාර සේවා ලබා දීමේදී දීර්ඝ කාලයක් තුළ සේවාවන් ලබා නොගෙන නිෂ්පාදන කටයුතු නවතා ඇති චිත්‍රපට සඳහා පොළිය ගිණුම්ගත කොට නොමැත.

ඉහත සඳහන් කරුණු 02 යටතේ වර්ෂයේ පොළිය ගණනය නොකලද , යම් අවස්ථාවක මෙම ණය මුදල් අය කර ගැනීමේදී පොළිය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.13.4සිනමාහල් අධිභාර

සිනමාශාලා වලින් ලැබිය යුතු චිත්‍රපට කුළිය සඳහා අයවිය යුතු අධිභාර මුදල 100%ක් නොලැබේය යන පදනම මත 25% ක් පමණක් ආදායමට ගෙන තිබේ.

2.13.5 224ගොඩනැගිලි කුලී ආදායම

සංස්ථාවට අයිති වත්කමක් වන 224 ගොඩනැගිල්ල තාවකාලිකව කුලීයට දීමෙන් පහත ආයතනයන්ගෙන් ගොඩනැගිලි කුලි අයකරනු ලබයි.

		මාසික කුලිය	වාර්ෂිකව
01	සැලසිනේ ආයතනය	291,500.00	3,498,000.00
02	ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය	80,000.00	960,000.00
03	සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය	315,000.00	3,780,000.00
		686,500.00	8,238,000.00

2.13.6 සංස්ථා ගිණුමට ඇතුළත් නොවූ ව්‍යාපෘති

01.ළමුන් සඳහා සිනමා අධ්‍යාපනය **(Film Education for School Children)**

ලංකා බැංකු ජංගම ගිණුම් අංක - 5152460

මෙම ව්‍යාපෘතිය සඳහා සිලෝන් බිස්කට් ආයතනයෙන් මුදල් යොදා ඇත.

2019.12.31 දිනට ශේෂය 976,303.16

02 .සිනමා ශිල්පින්ගේ රක්ෂණය

ස්ටැන්ඩඩ් චාටර්ඩ් බැංකුව ගිණුම් අංක - 013514633 01.

මෙම ව්‍යාපෘතිය සඳහා පුද්ගලිකව මුදල් යොදවා ඇත. 2019.12.31 දිනට ශේෂය 0 වේ.

2.13.7ජනාධිපති සම්මාන උළෙළ

2017ජනාධිපති සම්මාන උළෙල වෙනුවෙන් 2019 වර්ෂය තුලදී දරා ඇති වියදම රු.26,172,934 ක්වන අතර එය මහා භාණ්ඩාගාරය ප්‍රතිපූර්ණය කල යුතු වුවද ප්‍රතිපූර්ණය කර ඇත්තේ රු,.මිලි.20 ක් පමණක් වන අතර ඉතිරි වියදමින් රු.මි.5, 000,000 මුදලක් මහා භාණ්ඩාගාර ණය මගින් ගිලව් කරගෙන ඇත.

2.13.8 සේවක වැටුප්

2001 වර්ෂයේ මුදල් අමාත්‍යාංශය විසින් නිර්දේශිත නිලවීර වාර්තාවල ඇති ක්‍රමවේදයක්‍රියාත්මක වීමේදී සංස්ථාව සතුව පැවති චිත්‍රපට බෙදා හැරීම පෞද්ගලික මණ්ඩල වලටපැවරීමෙන් සංස්ථා සේවකයින්ගේ වැටුප් සඳහා වූ වියදම් මහා භාණ්ඩාගාරය ප්‍රතිපූර්ණයකිරීමට එකග වීම තුල මෙම වැටුප් ප්‍රතිපූර්ණය සඳහා ලද මුදල් 2019 වර්ෂයේදී සේවකපාරිශ්‍රමික ප්‍රතිපූර්ණයක් සේ ගලපා ඇත.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019.12.31දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

			2019	2018
(03)	**විකුණුම්**		රු.	රු.
	එළිය කැවූ චිත්‍රපට	**3.1**	46,907,845	38,916,762
	ප්‍රදර්ශන	**3.2**	477,596	612,770
	චිත්‍රාගාරය	**3.3**	1,687,900	1,292,200
	වෙළඳ කටයුතු	**3.4**	1,727,133	2,256,939
			50,800,475	**43,078,671**

3.1 එළිය කැවූ චිත්‍රපට

දේශීය චිත්‍රපට කුළිය		
පෙරදිග චිත්‍රපට කුළිය		
බෙදා හැරීමේ කොමිස්		
දේශීය	12,550,578	12,942,272
විදේශීය	20,609,406	11,655,093
වැඩිවීම	7,915,187	8,506,324
සේවාවන් සඳහා කොමිස්	180,852	230,497
අධිභාරය	4,894,982	4,889,096
පරීක්ෂණ දඩ මුදල්	756,840	693,480
	46,907,845	38,916,762

3.2 ප්‍රදර්ශන

සිනේ ඇඩිස්	477,596	612,770
	477,596	612,770

3.3 චිත්‍රාගාරය

	චිත්‍රපට ප්‍රමාණය		
ශබ්ද		1,687,900	1,240,300
සංස්කරණය		-	51,900
රසායනාගාරය (කළු - සුදු)		-	-
		1,687,900	1,292,200

3.4 වෙළඳ කටයුතු

	ප්‍රමාණය		
සිනමා කාබන්		160,675	129,995
අමතර කොටස්		5,696	14,595
ලිපි ද්‍රව්‍යය		1,465,421	1,651,782
අභ්‍යන්තර භාවිතය			
අමතර කොටස්		9,469	16,266
ලිපි ද්‍රව්‍යය පිරිවැය		85,872	444,301
		1,727,133	2,256,939

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

(04) විකුණුම් පිරිවැය

	ප්‍රදර්ශන	චිත්‍රාගාරය	නිෂ්පාදන	පොදු පරිපාලන වියදම්	2019 එකතුව	2018 එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
තොගය 2019.01.01	5,253,887	1,409,412	-	5,156,233	11,819,532	11,158,240
එකතු කළා :						
මිල්දී ගැනීම් හා මාරු කිරීම්	-	-		3,905,932	3,905,932	2,465,631
	5,253,887	1,409,412	-	9,062,165	15,725,464	13,623,871
අඩු කළා :						
තොග පාඩුවීම්	-					
මාරු කිරීම්	-					
2019.12.31 අවසන් තොගය	5,253,887	1,409,412	-	4,637,934	11,301,233	11,819,532
	-	**-**	**-**	**4,424,231**	**4,424,231**	**1,804,339**

දීර්ඝ සටහන් සඳහා (4- ඒ) , (4-බී) සහ (4- සී) සටහන් බලන්න.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

(04 - A) විකුණුම් පිරිවැය

		තොගය 2019.01.01	මිලදී ගැනීම්	එකතුව	තොගය 2019.12.31
		රු.	රු.	රු.	රු.
එළිය කැවූ චිත්‍රපට					
දේශීය		3	-	3	3
බටහිර		244	-	244	244
පෙරදිග		471	-	471	471
		718	-	718	718
මුද්‍රා නොහල චිත්‍රපට					
දේශීය		3,043,931	-	3,043,931	3,043,931
බටහිර		982,492	-	982,492	982,492
පෙරදිග		8	-	8	8
එකතුව		4,026,431	-	4,026,431	4,026,431
		4,027,149	-	4,027,149	4,027,149

		2019		2018
		රු.		රු.
තොගය 2019.01.01		-		-
එකතු කළා :	මිලදී ගැනීම්	-		-
	ප්‍රචාරණය	-		-
		-		-
අඩු කළා :	තොගය 2019.12.31	-		-
	පිරිවැය	-		-
එකතු කළා:	අනෙකුත් චිත්‍රපට			
තොගය 2019.01.01				
I. ප්‍රතිශත පදනම මත	259,890	-	259,890	
II. සිනේ සිත්තම්	966,848	1,226,738	966,848	1,226,738
එකතු කළා :	වියදම්	-		-
		1,226,738		1,226,738
අඩු කළා :	මාරු කිරීම්			
තොගය 2019.12.31				
I. ප්‍රතිශත පදනම මත	259,890	-	259,890	-
II. සිනේ සිත්තම්	966,848	1,226,738	966,848	1,226,738
මුළු පිරිවැය		-	-	-

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

(04 - B) විකුණුම් පිරිවැය

	දළ සේයාපට	සිනමා කාබන්	අමතර කොටස්	රසායන ද්‍රව්‍ය	ලිපි ද්‍රව්‍ය	එකතුව 2019	එකතුව 2018
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක තොගය 2019.01.01	287,951	1,170,579	277,864	-	3,419,839	5,156,233	4,494,941
එකතු කළා :							
මිලදී ගැනීම් හා මාරු කිරීම්	-	-	-	-	3,905,932	3,905,932	2,465,631
	287,951	1,170,579	277,864	-	7,325,771	9,062,165	6,960,572
අඩු කළා :							
තොග හානිවීම							
2019.12.31 අවසන් තොගය	287,951	1,018,492	267,748	-	3,063,743	4,637,934	5,156,233
	-	**152,087**	**10,116**	**-**	**4,262,028**	**4,424,231**	**1,804,339**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2019.12.31 දිනට අවසන් වර්ෂයේ

ආදායම් ප්‍රකාශන සඳහා සටහන් (චිත්‍රාගාරය)

(04 - C) විකුණුම් පිරිවැය

	දළ සේයාපට	සිනමා කාබන්	අමතර කොටස්	රසායන ද්‍රව්‍යය	එකතුව 2019	එකතුව 2018
	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක තොගය - 2019.01.01	816,569	-	538,753	54,090	1,409,412	1,409,412
මිලදී ගැනීම්	-	-	-	-	-	-
	816,569	-	538,753	54,090	1,409,412	1,488,344
අඩු කළා :						
තොග හානිවීම	-	-	-	-	-	-
මාරු කිරීම්	-	-	-	-	-	-
2019.12.31 අවසන් තොගය	816,569	-	538,753	54,090	1,409,412	1,409,412
වර්ෂය තුළ අභ්‍යන්තර පාවිච්චිය	-	-	-	-	-	-

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 05

		2019	2018
		රු.	රු.
සේවක පාරිශ්‍රමිකය			
වැටුප් හා වේතන		53,681,072	42,973,075
අතිකාල, නිවාඩු පඩි හා වන්දි		9,307,207	4,838,815
සේවක අර්ථසාධක හා භාරකාර අරමුදලට දායක මුදල්		10,238,526	8,074,850
වෙනත් දීමනා		16,702,755	24,728,678
		89,929,560	80,615,419

සටහන : 06

ගමන් හා යැපීම් දීමනා

ගමන් වියදම්	(දේශීය)	61,439	121,719
	(විදේශීය)	524,890	1,077,204
යැපීම් දීමනා		799,720	190,251
		1,386,049	1,389,173

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 07

	2019 රු.	2018 රු.
සැපයුම් හා උපකරණ		
ලිපි ද්‍රව්‍යය හා කාර්යාලීය උපකරණ	2,732,085	2,065,529
විදුලිය	5,888,347	4,869,052
සංග්‍රහ වියදම්	478,310	189,929
යාන්ත්‍රික හා විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම්	43,867	73,645
	9,142,609	7,198,155

සටහන : 08

අළුත්වැඩියා කිරීම් , නඩත්තු හා ක්ෂයවීම්

ඉන්ධන, ලිහිසි තෙල් හා රථවාහන නඩත්තු	5,251,490	4,732,661
නඩත්තු	2,930,222	2,449,990
ක්ෂයවීම්	22,293,932	25,755,076
	30,475,643	32,937,727

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 09

	2019	2018
	රු.	රු.
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවාවන්		
ප්‍රවාහනය	119,719	64,382
සම්බන්ධතා	2,196,781	2,483,812
අවශ්‍යතා		
අභ්‍යන්තර පාවිච්චිය	67,061	460,567
විදේශීය චිත්‍රපට උළෙල	-	-
සුභසාධක වියදම්	2,856,366	2,941,760
සේවක බඳවා ගැනීම් හා පුහුණුව	2,689,691	719,647
ජල බිල්පත්	280,267	404,093
සාකච්ඡා හා සම්මන්ත්‍රන	567,036	247,477
චිත්‍රපට සංරක්ෂණය	285,085	2,241,138
වරිපනම් බඳු	829,313	829,313
සිනමා කෞතුකාගාර ගිණුම	16,463	-
වෙනත් සේවා		
අධ්‍යක්ෂක ගාස්තු	1,249,804	837,099
ප්‍රචාරණය	443,757	709,829
විශේෂ කොමිෂන් ගාස්තු	182,644	370,379
නීති ගාස්තු	895,762	489,415
සංස්ථා උළෙලයන්	1,372,811	1,267,391
විගණන ගාස්තු	700,000	700,000
ආරක්ෂක සේවා	4,982,550	5,169,591
බැංකු ගාස්තු	139,028	83,749
සිනමා අධ්‍යාපන	774,110	705,865
පිටස්තර මරණාධාර හා සිනමා ශිල්පීය වියදම්	968,050	943,635
නව සිනමාහලේ වියදම්	192,515	484,240
තිර නාටක කියවීම	21,000	6,000
ප්‍රමාද ගාස්තු	16,034	10,872
සනිපාරක්ෂක සේවා	5,555,388	2,310,301
සේවක ණය පොලී පිරිවැය	1,552,869	968,843
(-) සේවක ණය පොලී ආදායම	(1,552,869)	(968,843)
ස්තවර වත්තම් ඉවත් කිරීමේ අලාභය	-	6
චිත්‍රපට වර්ගීකරණ වියදම්	608,519	-
ජනාධිපති සම්මාන උළෙල	26,172,934	-
විමර්ශන නිලධාරී- ගෙවීම්	190,500	-
	54,373,187	24,480,563
ජනාධිපති සම්මාන උළෙල වියදම් ප්‍රතිපූර්ණය	(20,000,000)	-
ජනාධිපති සම්මාන උළෙල වියදම් භාණ්ඩාගාර ණය මගින් හිලව් කිරීම	(5,000,000)	-
	29,373,187	24,480,563

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 10	**2019**	**2018**
වෙනත් ආදායම්	රු.	රු.
ලාභාංශ ආදායම	39,697	20,000
නිෂ්පාදන ණය පොලී	5,761	2,163,409
සේවක ණය පොලී	499,137	484,421
විවිධ ආදායම්	867,346	2,960,735
පිටස්තර රූගත කිරීම්	3,772,713	4,580,700
සංස්ථාවට අයත් නොවන චිත්‍රපට අළුත්වැඩියා කිරීම් සඳහා	85,039	120,417
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොලී	27,615,541	25,428,638
අයදුම්පත් ගාස්තු	1,165,930	883,000
එන්.එෆ්.සී. සිනමාහලේ ආදායම	6,613,699	4,329,875
චිත්‍රපට නැරඹීම සඳහා ලැබීම්	30,000	-
තිරනාටක සඳහා අනුමැතිය	35,000	5,000
224 ගොඩනැගිලි කුලී ආදායම	8,238,000	8,658,000
පාඨමාලාවන් සඳහා ලැබීම්	1,082,500	1,542,000
භාණ්ඩාගාර ලැබීම් ආදායමට හඳුනා ගැනීම්	17,021,778	20,168,009
විනිමය අනුපාත ගැලපීම	(29,613)	99,345
දේශන ශාලාවේ ආදායම්	67,500	166,150
රක්ෂණ සංස්ථාවෙන් ලද වන්දි	-	11,300
ප්‍රචාරක පුවරු	386,567	7,500
වත්කම් ඉවත්කම් කිරීමේ ගිණුම	-	50,249
විදේශ චිත්‍රපට ආනයනකරුවන් ලියාපදිංචි ගාස්තු	475,000	575,000
සේවක දඩ මුදල්	-	466,999
විමර්ශන නිළධාරී ලැබීම් හා වාර්තාමය චිත්‍රපට සඳහා අනුමැතිය	641,000	-
	68,612,595	**72,720,747**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2019 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 11 - ස්ථාවර වත්කම්

දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	පිරිවැය	වර්ෂය තුල එකතු කිරීම්	පෙර වර්ෂයේ පිරිවැය වෙනුවෙන් කල ගැලපීම්	පිරිවැය	සමුච්චිත ක්ෂයවීම්	වර්ෂය සඳහා ක්ෂයවීම්	පෙර වර්ෂයේ ක්ෂය වෙනුවෙන් කල ගැලපීම්	සමුච්චිත ක්ෂයවීම්	ශුද්ධ අගය
	2019.01.01			**2019.12.31**	**2019.01.01**				**2019.12.31**
	රු.	**රු.**	**රු.**	**රු.**	**රු.**	**රු.**		**රු.**	**රු.**
01. සින්නක්කර ඉඩම්	174,343,458.00	-	-	174,343,458	-	-	-	-	174,343,458
02. සින්නක්කර ගොඩනැගිලි	146,866,590	2,746,838	499,201	149,114,227	60,932,895	5,881,715	24,960	66,789,650	82,324,577
03. සිනමා සංකීර්ණය	125,789,704	3,265,961	6,218,233	122,837,432	74,213,774	5,183,708	621,823	78,775,659	44,061,773
04. මිනි සිනමා උපකරණ	331,451	-	-	331,451	331,449	-	-	331,449	2
05. ලී බඩු , සවි කිරීම් හා වෑද්දූම්	18,851,777	5,668,300	-	24,520,077	16,350,814	982,114	-	17,332,928	7,187,149
06. කාර්යාලීය උපකරණ	25,722,928	2,112,480	-	27,835,408	17,373,942	1,578,863	-	18,952,805	8,882,603
07. මෝටර් රථ	18,182,879	-	-	18,182,879	10,082,877	2,700,000	-	12,782,877	5,400,002
08. චිත්‍රපට සංරක්ෂණය	1,610,655	493,800	-	2,104,455	1,256,924	146,659	-	1,403,583	700,872
09. පාපැදි	18,281	-	-	18,281	18,277	-	-	18,277	4
10. චිත්‍රපට උපකරණ	910,689	-	-	910,689	762,830	49,280	-	812,110	98,579
11. ප්‍රක්ෂේපණ උපකරණ	925,202	-	-	925,202	603,939	50,209	-	654,148	271,054
12. චිත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර	93,758,992	4,262,559	25,875	97,995,676	85,835,263	5,644,608	2,588	91,477,284	6,518,393
13. සිනමා අධ්‍යාපන උපකරණ	1,241,350	-	-	1,241,350	961,744	75,204	-	1,036,948	204,402
14. සුභසාධන උපකරන	210,677	-	-	210,677	198,103	1,572	-	199,675	11,003
	608,764,633	**18,549,939**	**6,743,309**	**620,571,262**	**268,922,831**	**22,293,932**	**649,371**	**290,567,392**	**330,003,870**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

		2019	2018
		රු.	රු.
සටහන : 12			
දිගු කාලීන ආයෝජන			
ස්ථාවර තැන්පතු		23,463,724	21,461,312
සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම		127,000	127,000
		23,590,724	21,588,312
සටහන : 13			
කෙටි කාලීන ආයෝජන			
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සේවක		5,000	5,000
රිපෝ තැන්පතු		201,624,456	187,811,682
භාණ්ඩාගාර බිල්පත්		113,601,156	108,004,238
		315,230,612	295,820,920
සටහන : 14			
තොග			
චිත්‍රපට		5,253,887	5,253,887
වෙළඳ කටයුතු		4,349,983	4,868,282
චිත්‍රාගාරය		1,697,363	1,697,363
චිත්‍රාගාරය නඩත්තු අමතර කොටස්		1,472,575	1,472,575
ලිපි ද්‍රව්‍යය හා වෙනත්		2,126,924	1,355,400
		14,900,732	14,647,507
සෙමින් අලෙවි වන සහ අලෙවි නොවන තොග සඳහා වෙන් කිරීම්		(8,597,176)	(8,597,176)
		6,303,556	6,050,331
සටහන : 15			
ණයගැතියෝ			
සිනමාහල්	362,063,333		
(-) අධිභාර වෙන් කිරීම්	(148,844,015)		
(-) ණයගැතියන් සඳහා හානිකරණ ගැලපීම 16ඒ	(111,603,285)	101,616,033	103,789,395
නිෂ්පාදකයෝ	83,569,548.76		
(-) නිෂ්පාදන ණය පොලි වෙන් කිරීම්	(4,618,805.70)		
(-) ණයගැතියන් සඳහා හානිකරණ ගැලපීම 16ඒ	(63,479,254.89)	15,471,488	23,584,897
		117,087,522	127,374,293
සටහන : 16			
විවිධ ණයගැතියෝ			
වෙනත්		175,766,202	176,195,055
විවිධ ණයගැතියෝ සඳහා හානිකරන ගැලපීම(සටහන 16 ඒ)		(8,788,310)	(8,809,753)
සේවක අත්තිකාරම්		22,375,488	23,350,831
සේවක ණය වත්කම් ගිණුම		1,467,383	3,224,642
(-) සේවක ණය වගකීම් ගිණුම		(1,467,383)	(3,224,642)
		189,353,380	190,736,133

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

අඩමාන ණය සඳහා වෙන් කිරීම් උපලේඛනය

සටහන : 16 ඒ

ණයගැතියෝ	එකතුව 2019	එකඟ නොවූ හා අය කර ගත නොහැකි	අය කර ගත හැකි	5% වෙන් කිරීම්	මුළු වෙන් කිරීම්
	රු.	රු.	රු.	රු.	රු.
සිනමාහල්	362,063,333	98,421,177	263,642,156	13,182,108	111,603,285
නිෂ්පාදකයන්	83,569,549	62,421,871	21,147,678	1,057,384	63,479,255
වෙනත්	175,766,202		175,766,202	8,788,310	8,788,310
සේවක ණය	20,847,308	-	20,847,308	-	-
	642,246,391	**160,843,048**	**481,403,343**	**23,027,802**	**183,870,850**

		සිනමාහල්	නිෂ්පාදකයන්	වෙනත්
ශේෂය ඉ / ගෙ	183,660,809	110,944,780	63,906,276	8,809,753
ලාභාලාභ ගිණුමට මාරු කළා	210,041	658,505	(427,021)	(21,443)
	183,870,850	**111,603,285**	**63,479,255**	**8,788,310**

ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම්	
2019.01.01 දිනට	183,660,809
ලාභාලාභ ගිණුමට මාරු කළා	210,041
ශේෂය ප/ගෙ 2019.12.31	**183,870,850**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

	2019	2018
	රු.	රු.
සටහන : 17		
තැන්පතු හා ඉදිරියට ගෙවීම්		
තැන්පතු	3,792,893	4,209,588
අත්තිකාරම් ගෙවීම්	492,508	321,574
	4,285,401	4,531,162
නොලැබිය හැකි ණය සඳහා හානිකරන ගැලපීම	(653,728)	(653,728)
	3,631,673	3,877,434
සටහන : 18		
මුදල් හා බැංකු ශේෂ		
මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-1-0208647	874,707	1,585,453
මහජන බැංකුව - ජ. ගි. අ. 055-1-001-5-0667533	1,530,032	2,124,340
මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-6-0208664	3,420,112	7,166,206
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323272	(241,062)	4,863,086
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323131	792,846	952,745
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323354	4,328,874	6,296,658
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323363	11,035,364	6,715,678
ලංකා බැංකුව - ජ. ගි. අ. 0005002189	763,288	5,223,378
ලංකා බැංකුව - ජ. ගි. අ. 5152460	976,303	976,303
	23,480,463	35,903,848
අත ඉතිරි මුදල්		
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය	36,134	48,971
සුළු මුදල් - චිත්‍රාගාරය	24,970	(4,805)
සුළු මුදල් - චිත්‍රපට ගබඩාව	34	34
	61,138	44,200
එකතුව	23,541,601	**35,948,047**
සටහන : 19		
ප්‍රදානයන්		
භාණ්ඩාගාර ප්‍රදානයන්	104,181,910	124,349,919
(-)ක්‍රමක්ෂය	(17,021,778)	(20,168,009)
	87,160,132	104,181,910

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

		2019	2018
සටහන : 20			
පාරිතෝෂික වෙන් කිරීම්			
ඉදිරියට ගෙනා ශේෂය - 2019.01.01		43,151,056	40,228,205
2018 වර්ෂයේ ඌන වෙන් කිරීම		497,151	-
වර්ෂය සඳහා වෙන් කිරීම්		3,486,140	7,131,374
මුදල් ගෙවීම්		(4,768,794)	(4,208,523)
		42,365,554	43,151,056.29
(භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇත.)			
සටහන : 21			
තැන්පතු			
එන්.එෆ්.සී. සිනමාශාලා ඇප තැන්පතු		430,272	295,272
ආපනශාලා තැන්පතු		35,000	30,000
ආරක්ෂක තැන්පතු -	සිනමාශාලා	2,573,754	2,326,727
	සේවක	5,000	5,000
	චිත්‍රපට ආනයන	7,500	7,500
	සිනමා ව්‍යාපෘතිය	45,000	45,000
	සනිපාරක්ෂක සේවා	160,000	260,000
		3,256,525	2,969,499
සටහන : 22			
චිත්‍රපට කුලී ණයහිමියෝ			
චිත්‍රපට කුලී ණයහිමියෝ		269,193,607	271,145,270
(-) ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම		(18,046,804)	(18,046,804)
		251,146,803	253,098,466

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 23

වෙනත් ණයහිමියෝ

උපචිත වියදම් (මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 2.10 යටතේ දක්වා ඇත)	46,297,558	63,895,493
ගෙවිය යුතු එකතු කල අගය මත බදු	152,612	152,612
විගණන ගාස්තු ප්‍රතිපාදන	3,215,795	2,515,795
දේශීය ආදායම් කොමසාරිස් (මුද්දර)	55,848	75,022
හිමිකම් නොපැවේතන	947,611	944,912
සේවක අර්ථසාධක අරමුදල	1,901,241	656,726
සේවක භාරකාර අරමුදල	242,662	72,955
විවිධ ණයහිමියෝ	1,429,773	759,853
(-) නොගෙවිය යුතු වගකීම් සඳහා වෙන් කිරීම්	(644,840)	(644,840)
මහා භාණ්ඩාගාරය	-	5,000,000
ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල	3,697,545	3,557,545
රිත්මා මණ්ඩල පාලන ගිණුම	5,316,841	5,542,572
උපයන විට බඳු ගෙවීම	38,253	35,304
වැටුප් හා වේතන වෙන් කිරීමේ ගිණුම	577,190	550,887
ලැබිය යුතු නිෂ්පාදන ණය පොලී වෙන් කිරීම	1,028,122	1,028,122
සුබ සාධක සංගමයට මරණාධාර අත්තිකාරම්	-	46,150
ප්‍රසිද්ධ රුගුම් පාලක මණ්ඩලය	114,801	682,973
චිත්‍රපට ප්‍රතිශ්ඨාපනය	(485,692)	2,446,017
සිලොන් බිස්කට් සමාගම	976,303	976,303
	64,861,624	88,294,402

අංකය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම	පත්වීම් දිනය	දරන තනතුර හා සේවා ස්ථානය/ලිපිනය	ලිපිනය
1.	අනුෂා ගෝකුළ ප්‍රනාන්දු මහත්මිය	2019.02.01-2019.12.06	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති සභාපති - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	සභාපති ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව කොළඹ 07.
2.	කුමාර ජයකාන්ත මහතා	2019.02.06-2019.12.05	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ක්‍රියාකාරී අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	ක්‍රියාකාරී අධ්‍යක්ෂ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව කොළඹ 07.
3.	ඒරානන්ද හෙට්ටිආරච්චි මහතා	2016.06.07,-2019.12.05	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිලබලයෙන්) අධ්‍යක්ෂ ජනරාල් - ගුවන් විදුලි සංස්ථාව	අධ්‍යක්ෂ ජනරාල් ගුවන් විදුලි සංස්ථාව, කොළඹ 07.
4.	නාලක කළුවැව මහතා	2018.12.04 - 2019.12.05	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිලබලයෙන්) අධ්‍යක්ෂ ජනරාල් - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව. කොළඹ 05
5.	සුධීර නිලංග විතාන මහතා	2019.02.01 සිට 2019.05.22	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිලබලයෙන්) සහකාර අධ්‍යක්ෂ - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව (සංස්කෘතික අධ්‍යක්ෂ වෙනුවට)	සහකාර අධ්‍යක්ෂ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
	බී.ජී.එව්.ඒ.දුලන්ති මිය	2019.05.23-2019.12.05	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිලබලයෙන්) සහකාර අධ්‍යක්ෂ - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව (සංස්කෘතික අධ්‍යක්ෂ වෙනුවට)	සහකාර අධ්‍යක්ෂ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
6.	අනුර රත්නායක මහතා	2019.02.06-2019.12.05	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක : 103/9, මුතු හේනවත්ත, ජයබෝ මාවත, මීගොඩ.
7.	පී.වී.පී.දයාරත්න මිය	2015.02.06-2018.11.07 නැවත 2019.02.06 -2019.12.05	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක.59/3, නීතාරිකුඹුර, තලංගම උතුර, බත්තරමුල්ල.
8.	මහාචාර්ය පැට්‍රික් රත්නායක	2019.02.06 -2019.12.05	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික පීඨාධිපති- මානව ශාස්ත්‍ර අධ්‍යයයන පීඨය,	පීඨාධිපති, මානව ශාස්ත්‍ර අධ්‍යයයන පීඨය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.
09	මහාචාර්ය කේ.ඒ.අමරසේකර	2019.03.07-2019.12.05	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	588/4, නිසංගල පෙදෙස, ඇරව්වල දකුණ, පන්නිපිටිය.
10.	බී.එම්.ඩී.එන්.බාලසූරිය මිය	2017.03.17 -2019.12.05	භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂ - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, මහ ලේකම් කාර්යාලය, කොළඹ 01.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } සිඒඑස්/සි/එන්එෆ්සී/1/19/එෆ්ඒ

මබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2020 නොවැම්බර් 19 දින

සභාපති

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 හි 32 වන ඡේදයට පටහැනිව ජනාධිපති සිනමා සම්මාන උළෙලට භාණ්ඩාගාරයෙන් ලද රු.මිලියන 20 ක් ආදායමට හඳුනා නොගෙන එම උළෙලේ වියදම වූ රු.මිලියන 26.2 කට හිලව්කර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 හි 7 වන ඡේදය ප්‍රකාරව, මාස තුනක කාලයක් තුළදී කල් පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් 14 ක වටිනාකම රු.63,426,512 ක් හා භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම් (Repo) 19 ක වටිනාකම රු.201,932,207 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 79 (අ) ඡේදය ප්‍රකාරව නිෂ්කාර්ය වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ පොත් අගය හෙළිදරව් කළයුතු වුවත් සංස්ථාවේ කැලණිය චිත්‍රාගාරයේ කලුසුදු සහ වර්ණ රසායනාගාරවලට අයත් තාක්ෂණය හා යල්පැනගිය-පැරණි වත්කම්, ගිණුම්ගත කිරීම පිළිබඳව හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 හි 119 ඡේදය ප්‍රකාරව කැලණිය සරසවි චිත්‍රාගාරයේ පශ්චාත් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන මෘදුකාංගය මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 හි 75 (ඇ) ඡේදය ප්‍රකාරව, ආයෝජන වත්කම් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වුවත් සංස්ථාව විසින් වසර 17 ට වැඩි කාලයක සිට රැගුම් පාලක මණ්ඩලයට, සැලසිනේ ආයතනයට සහ සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයට කුලියට ලබාදී ඇති ගොඩනැගිල්ලක් පිළිබඳව සුදුසු අනාවරණය කිරීම් සිදුකර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18 හි 35 (අ) ඡේදය ප්‍රකාරව ආදායම් ගිණුම් තැබීම සම්බන්ධව ගිණුම්කරණ ප්‍රතිපත්තිය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඔ) දේපල ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය පිරිවැයට හෝ තක්සේරු අගයට බව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර තිබුණද සංස්ථාවට අයත් බෞද්ධාලෝක මාවතේ පිහිටි වරිපනම් අංක 224 ඉඩම සහ කැලණිය චිත්‍රාගාරයේ ඉඩම තක්සේරු කර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) 1999 වර්ෂයේ දී සංස්ථාව සතුව පැවති චිත්‍රපටි බෙදාහැරීමේ ඒකාධිකාරය අහෝසි කිරීමත් සමඟ සංස්ථාව සතුව පැවති ප්‍රධාන ආදායම් මාර්ගයක් වූ බෙදා හැරීමේ කොමිස් මුදල අහිමි වී තිබුණි. ඒ හේතුවෙන් සංස්ථාවේ ආදායම, වියදම් පියවා

ගැනීමට ප්‍රමාණවත් නොවීම මත මහා භාණ්ඩාගාරය විසින් 2011 වර්ෂයේ සිට සේවක වැටුප් සඳහා ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 5 ක කාලය තුළ සංස්ථාව භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර දිගින් දිගටම අලාභ ලැබීමේ තත්ත්වයක් නිරීක්ෂණය වූ අතර රජයේ මූල්‍ය සහායක් නොමැතිව හෝ චිත්‍රපට බෙදාහැරීම සංස්ථාවට ලබා ගැනීමේ නීතිමය කටයුත්ත සාක්ෂාත් කර ගැනීමකින් තොරව සංස්ථාව අඛණ්ඩව පවත්වා ගෙන යාම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය.

කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) , 1.2 (ඇ) , 1.2 (ඈ) , 1.2 (ඉ) ,1.2 (උ) ,1.2 (ඌ), ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති, විධානයට යොමුව	විස්තරය
(අ) 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 27 වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) සහ 11 වගන්ති	2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ ආදායම් අතිරික්තය රු.173,169,736 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණු අතර මුදල් ඇමතිවරයාගේ හා අදාළ ඇමතිවරයාගේ අනුමැතියකින් තොරව එකතු වූ පොළියද ඇතුළත්ව රු.115,091,406 ක් හා රු.201,624,456 ක් පිළිවෙළින් භාණ්ඩාගාර බිල්පත්වල හා භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම්වල ආයෝජනය කර තිබුණි.
(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 7(2) වගන්තිය	සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.80,750,000 ක් වූ රජයේ ප්‍රදාන සංස්ථාවේ ලාභය/ අලාභය ගණනය කිරීමෙන් පසුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පෙන්වා තිබුණි..
(ඇ) 1999 ජුනි 17 දිනැති ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා මාර්ගෝපදේශය 9 ඡේදය	චිත්‍රපට සුරක්ෂිතාගාරයක් පිහිටුවා එහි කළමනාකරණය සංස්ථාව විසින් පවත්වාගෙන යා යුතු වුවත් සංස්ථාව සතු පැරණි චිත්‍රපට 273 ක් පමණ ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සුරක්ෂිතාගාරයක තැන්පත් කර තිබුණු අතර 1947 වර්ෂයේ සිට තිරගත වූ චිත්‍රපට 987 ක් සහ නව චිත්‍රපටවල පිටපත් සුරක්ෂිත කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස්කර තිබුණද එම කටයුතු අධීක්ෂණය හා පසු විපරම් කිරීම සිදුවී නොතිබුණි.
(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.381 (1)	රාජකාරී බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මගින් මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගත යුතු වුවත්, 2019 දෙසැම්බර් 31 දින වනවිට සංස්ථාව විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව බැංකු ජංගම ගිණුම් 09 ක් ආරම්භ කර තිබුණු අතර එදිනට එම බැංකු ගිණුම්වල පැවති ශේෂ එකතුව

රු.36,979,808ක් විය.

(ඉ)	2003 ජූනි 02 දිනැති හා අංක පිටි/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය	2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2020 සැප්තැම්බර් 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

- 2018 අක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්වතව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව,

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) වටිනාකම රු.316,715,862 ක් වූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම් සඳහා ප්‍රාථමික වෙළඳපලේ රාජ්‍ය බැංකුවලින් මිල ගණන් කැඳවා වඩා වාසිදායක පොලී අනුපාත මත ආයෝජනය කරනු වෙනුවට එක් බැංකුවක දිගින් දිගටම ආයෝජනය කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) චිත්‍රපට ක්ලාකරුවන් හා කාර්මික ශිල්පීන් සඳහා අරමුදල, රිත්මා මණ්ඩලය හා චිත්‍රපට සංවර්ධන අරමුදල සමග සංස්ථාව පවත්වාගෙන යන ජංගම ගිණුම් ශේෂ අතර 2019 දෙසැම්බර් 31 දිනට පැවති පිළිවෙලින් රු.43,771 ක, රු.5,316,841 ක, රු.3,697,545 ක නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සංස්ථාවට අයත් අංක 224 ගොඩනැගිල්ල රජයේ කුලී තක්සේරුව අනුව කුලී ගාස්තු තීරණය කිරීමෙන් තොරව අඩු කුලී ගාස්තුවක් මත රජයේ ආයතන දෙකකට බදුදීමට හා එම ආයතනවල ඉල්ලීම් සලකා බලා රජයේ තක්සේරුවට අඩුවෙන් බදු දීමට කටයුතු කර තිබුණි.

(ඈ) ළමුන් සඳහා වූ සිනමා අධ්‍යාපනය යටතේ වූ ව්‍යාපෘතියක් සඳහා සංස්ථාවේ ජංගම ගිණුමක රු.976,303 ක මුදලක් පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයේදී කිසිදු ව්‍යාපෘති කටයුත්තක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) සංස්ථාවේ වත්කම් කළමනාකරණය හා ඒවායේ ආරක්ෂාව සම්බන්ධ පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතියෙහි දුර්වලතා හේතුවෙන් පරිගණක යන්ත්‍ර හා වටිනා

කාර්යාලයිය උපකරණ 107 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට සංස්ථා භූමියෙන් ඉස්ථානගත වී තිබුණි. වත්කම් සත්‍යාපනයේදී හඳුනාගෙන ඇති එම භාණ්ඩ සම්බන්ධව සිදු වී ඇති අලාභ අය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) සිනමා ශාලා සඳහා පැනවූ පරීක්ෂණ දඩ මුදල්වලට අදාළව අයවිය යුතුව තිබුණු රු.263,940 කින් රු.182,798 ක් හෙවත් සියයට 70 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට අයකර ගෙන නොතිබුණි.

(උ) සංස්ථාව සතු බැංකු ජංගම ගිණුම් 9 ක 2019 වර්ෂය පුරාම පවත්වාගෙන තිබුණු සාමාන්‍ය මාසික ශේෂය රු.මිලියන 29.2 ක් පමණ වූ අතර එම මුදල් ඵලදායී ලෙස කෙටිකාලීනව ආයෝජනය කර අමතර ආදායම් ලබාගැනීම සඳහා අවධානය යොමුකර නොතිබුණි.

(ඌ) එකතුව රු.870,659 ක් වූ දළ සේයාපට සහ රසායන ද්‍රව්‍ය තොගය 2014 වර්ෂයේ සිට යල් පැන තිබූ නිසා ප්‍රයෝජනයට ගැනීමට නොහැකි තත්ත්වයකට පත්වී තිබුණි.

(එ) ප්‍රධාන ගබඩාවෙහි පැවති වර්ෂ 05 ක් ඉක්ම වූ චිත්‍රපට සහරා 7,917 ක ප්‍රමාණයක් අලෙවි කිරීමකින් තොරව හා ඉවත් කිරීමට ක්‍රියාමාර්ග නොගැනීම මත දිරාපත් වෙමින් පැවතුණු අතර කල් ඉකුත් වූ හා වර්තමානයේ ප්‍රයෝජනයට නොගන්නා භාණ්ඩ වර්ග 450 ක් පමණ ගබඩාවේ ඉඩ ප්‍රමාණයද අහුරාලමින් තබා තිබුණි. තවද, එම තොගවල පිරිවැය හෝ වර්තමාන අගය සංස්ථාවේ ලේඛනවල සඳහන්ව නොතිබුණි.

(ඒ) සිනමා ඉසිවර ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා නමින් කෞතුකාගාරයක් හා සිනමා පාසලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 99.9 ක ඇස්තමේන්තුවක් මත 2019 අප්‍රේල් 05 දින වැඩ ආරම්භ කර තිබුණු අතර 2019 ජූලි 10 දිනට ප්‍රථම වැඩ නිමකළ යුතුව තිබුණි. 2020 අප්‍රේල් 05 දිනට යෙදෙන එතුමාගේ ජන්ම දිනයේදී අංග සම්පූර්ණව කෞතුකාගාරය විවෘත කිරීමට සැලසුම් කර තිබුණද, එම ව්‍යාපෘතිය නිමකර නොතිබුණු අතර එම ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය හෝ ලබාගෙන නොතිබුණි.

(ඔ) සේවක අර්ථ සාධක අරමුදල සඳහා 2006 ජනවාරි සිට 2015 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයේදී ජීවන වියදම් දීමනාව නොසලකා දායක මුදල් ගණනය කිරීම හේතුවෙන් සේවායෝජකයාගේ දායකය රු.12,211,657 ක්, සේවකයාගේ දායකය රු.8,141,105 ක් හා ඒ මත අධිභාරය රු.10,176,381 ක් ගෙවීමට ඇති බව නඩු පැවරීමට පෙර කරනු ලබන අවසාන නිවේදනය මඟින් දන්වා තිබුණි. ඊට අමතරව සේවානියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායක මුදල් රු.2,763,753 ක් හා ඒ මත අධිභාරය රු.1,381,876 ක් අයවිය යුතු බව සංස්ථාවට දන්වා තිබුණි. කෙසේ වෙතත්

උධ්‍යාක්ෂ මණ්ඩල අනුමැතිය හා අධිභාරය සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පෙර වර්ෂ ගැලපීම් ලෙස සම්පූර්ණ ගෙවීම සඳහා රු.34,674,772 ක් මූල්‍ය ප්‍රකාශනවල 2018 වර්ෂයේදී ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඒ) සංස්ථාව විසින් ලංකා බැංකුවෙහි පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුමක 2019 දෙසැම්බර් මස 31 දිනට රු.241,062 ක බැංකු අයිරාවක් පැවතියද බැංකු අයිරා ලබා ගැනීමට සංස්ථාව විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ක) ප්‍රසිද්ධ රැහුම් පාලක මණ්ඩලයෙන් අයකරනු ලබන ගොඩනැගිලි කුලී ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.420,000 කින් අඩු වී තිබුණු අතර කුලිය අඩුකිරීමට දෙපාර්ශවය අතර එළඹී විධිමත් ගිවිසුමක් ඉදිරිපත් නොවූ අතර ගොඩනැගිලි කුලි සම්බන්ධව ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ග) නොගෙවූ වැටුප් ගිණුමෙහි වර්ෂ 04කට වඩා වැඩි කාලයක සිට පවතින රු.1,332,143 ක් අදාළ පුද්ගලයින් වෙත ගෙවීමට හෝ නැවත ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඝ) චිත්‍රපට නිෂ්පාදනය සඳහා චිත්‍රපට නිෂ්පාදකවරුන් වෙත 1975 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ ගෙවූ ණය වටිනාකමෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 71.32 ක් වූ අයවිය යුතු ශේෂයක් පැවතුණි. එම ණය වලින් රු.මිලියන 25.10 ක් චිත්‍රපට නිෂ්පාදනය සඳහා උපයෝජනය කර නොතිබුණු අතර රු.මිලියන 8.29 ක හිඟ ණය ශේෂයන්ට අදාළ නිෂ්පාදකවරුන් මියගොස් සිටීම හේතුවෙන් ණය අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. වර්ෂ 10 කට වැඩි කාලයක් කල්ගතවීම මත ණය අයකර ගැනීමේ නෛතික හැකියාව හීන වී තිබුණු අතර මේ සම්බන්ධව කටයුතු කිරීමට පත්කළ කමිටුව ක්‍රියාත්මක වී ඇති ආකාරය හා අයකරගත් ණය ශේෂ ප්‍රමාණය පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ච) මරදාන සිනේසිටි සිනමා ශාලාවෙන් 2003 වර්ෂයේ සිට 2016 මැයි 31 දින දක්වා අයවිය යුතු චිත්‍රපට කුලිය රු. 12,343,433 ක් 2020 සැප්තැම්බර් 15 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2016 මැයි 31 දිනට පසු දෛනික වාර්තා ගෙන්වා ගැනීමට පියවර ගෙන නොතිබීම හේතුවෙන් අයවිය යුතු චිත්‍රපට කුලී ආදායම ගණනය කිරීමට සහ ගිණුම්ගත කිරීමට නොහැකි වී තිබුණි.

(ඩ) සේවකයින් විශ්‍රාම ගැන්වීම වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු වන්දි මුදලින් ඉතිරිව පැවති රු. 5,000,000 ක් වර්ෂ 05 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණද නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණු අතර මෙම මුදල ජනාධිපති සම්මාන උළෙල සඳහා වූ භාණ්ඩාගාර දායකත්වය ලෙස අඩුකර තිබුණද ඊට භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

ජනාධිපති සම්මාන උළෙල සඳහා වූ භාණ්ඩාගාර දායකත්වය ලෙස ප්‍රතිකර තිබුණද ඊට භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(න) සේවක ණය අත්තිකාරම් ගෙවීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් වූ පද්ධතියෙහි වූ පාලන දුර්වලතා නිසා හඳුනාගත නොහැකි ණය අත්තිකාරම් ශේෂය 2019 දෙසැම්බර් 31 දිනට රු.539,221 ක් විය. එමෙන්ම වර්ෂ 04 ඉක්ම වූ අයකර නොගත් ණය අත්තිකාරම් රු.165,807 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ප) 2016, 2017 හා 2018 වර්ෂ තුන සඳහා 2019 ජූලි 26 දින පවත්වනු ලැබූ ජනාධිපති සිනමා සම්මාන උළෙල වෙනුවෙන් උත්සව දින ඇස්තමේන්තුගත සංග්‍රහ වියදම රු.1,707,300 ක් වූ අතර සත්‍ය වියදම රු.2,687,430 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුගත වියදම ඉක්මවා සියයට 57.4 ක් වැයකර තිබුණු අතර ඊට බලපෑ හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඇගයීම්ට භාජනය වී නොතිබුණි.

(බ) 2019 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාර්යය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව 52 ක් වූ අතර වර්තමාන අවශ්‍යතාවයන් අනුව අනුමත කාර්ය මණ්ඩලය සමාලෝචනය කර නොතිබුණි. එමෙන්ම, අත්‍යාවශ්‍ය මෘණ්ඩලික තනතුරු 7 ක්, දීර්ඝ කාලයක සිට පුරප්පාඩු වී පැවති අතර මෙම තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් 4 ක් හා රාජකාරී ඉටු කිරීමේ පදනම මත නිලධාරීන් 3 ක් පත්කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති